**ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය - 2019**
**-----------------------------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය
**----------------------------**

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ (ජා.ජ.ස.ජ.ම) 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
**---------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්
**------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාල ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රමිතයෙහි (ශ්‍රී.ලං.ගි.ප්‍ර 01) ඡේද අංක 32 ට පටහැනි ලෙස ජංගම වත්කම් නියෝජනය කරනු ලබන වෙළඳ ලැබිය යුතු දෑ සහ ණයගැති එකතු කිරීම් පාලන ගිණුමෙහි වූ රු.9,772,912 ක බැර ශේෂයක් ගෙවිය යුතු දෑට එරෙහිව හිලව් කොට සමාලෝචිත වර්ෂය අවසානයට වූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ ක්‍රියාකාරී නොවන වගකීම් ලෙස හඳුනාගෙන තිබුණි. ඊට සමානව ජංගම වගකීම් නියෝජනය කරනු ලබන ලද රඳවාගැනීම්හි හර ශේෂය වූ රු.1,078,112 ක් ලැබිය යුතු දෑට එරෙහිව හිලව් කොට සමාලෝචිත වර්ෂය අවසානයට වූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ ක්‍රියාකාරී නොවන වත්කම් ලෙස හඳුනාගෙන තිබුණි. තවද, ප්‍රදාන ලෙස ලැබී තිබුණු පරිගණක මෘදුකාංගවලට අදාළව රු.1,043,784 ක ක්ෂය වීම් සහ විලම්භීත ආදායම් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ තුළ වෙනම දැක්වීමකින් තොරව එකිනෙකට හිලව් කොට තිබුණි. | හස්තපොත් පද්ධතිය පරිගණකගත කරමින් තිබීම හේතුවෙන් මෙම ශේෂයන් සිට 1999 වර්ෂයේ පැවතෙමින් පවතී. | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 (ශ්‍රී.ලං.ගි.ප්‍ර 01) සමඟ අනුකූල වන බවට සහතික විය යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| ii. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයේ (ශ්‍රී.ලං.ගි.ප්‍ර 07) 07 වන ඡේදයට පටහැනිව, ඉතිරිකිරීම් ගිණුමක තැන්පත් කරනු ලැබූ රු.1,361,683 ක් ජංගම නොවන වත්කම් යටතේ වර්ගීකරණය කර තිබුණි. | තැන්පතුව කෙටි කාලීනව භාවිතා කිරීමේ අදහසින් සිදු කර නොමැත. එබැවින් මෙය මුදල් ප්‍රවාහයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් බැහැර කළ හැකිය. | වත්කම්, ජංගම හා ජංගම නොවන වත්කම් ලෙස වර්ගීකරණය කිරීමේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07 (ශ්‍රී.ලං.ගි.ප්‍ර 07) සමඟ අනුකූල වන බවට සහතික විය යුතු වීම. |
| iii. | දේපල, පිරියත සහ උපකරණ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (ශ්‍රී.ලං.ගි.ප්‍ර 16) 51 වන ඡේදයට අනුව, වත්කම්වල ඵලදායී ජීව කාලය අවම වශයෙන් ඒ ඒ ගිණුම් වර්ෂය තුළදී සමාලෝචනය කොට අපේක්ෂාවන් පෙර ඇස්තමේන්තු සමඟ වෙනස් වේ නම් එම වෙනස්කම් ශ්‍රී.ලං.ගි.ප්‍ර 08 අනුව ගිණුම් ගත කළ යුතු වේ. කෙසේ වෙතත් මේ වන විටත් භාවිතයට ගැනෙන වටිනාකම රු.1,813,275,339 ක් වන සම්පූර්ණ යෙන් ක්ෂය කරන ලද වත්කම්වල ඵලදායී ජීවිත කාලය සමාලෝචනය කර ඒ අනුව ගිණුම් ගත කර නොතිබුණි. | අතිවිශාල වත්කම් පදනමක් රට පුරා විසිරී ඇති බැවින් මණ්ඩලයේ වත්කම් පදනම අගය කිරීම ප්‍රායෝගික නොවේ . | මණ්ඩලය විසින් භාවිතා කරනු ලබන සම්පූර්ණයෙන්ම ක්ෂය වූ වත්කම්වල ඵලදායී ජීවිත කාලය නැවත තක්සේරු කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 (ශ්‍රී.ලං.ගි.ප්‍ර 16) සමඟ අනුකූල වන බවට සහතික විය යුතු බව. |
| iv. | සේවක ප්‍රතිලාභ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (ශ්‍රී.ලං.ගි.ප්‍ර 19) ඡේද අංක 66 හා 144 ට අනුව මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේ විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් හි වර්තමාන අගය හා අදාල වර්තමාන සේවා පිරිවැය මැනීම සඳහා සත්‍ය උපකල්පන යොදාගෙන සත්‍ය ආගණන ක්‍රමයක් භාවිතා නොකරන බවත්, ඒවා අනාවරණය කර නොමැති බවත් විගණනයේදී අනාවරණය විය. තවද, ප්‍රමිතයෙහි 58 වන ඡේදයේ අවශ්‍යතා අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන් තුල විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් (පාරිතෝෂික ප්‍රතිපාදන) සඳහා වෙන් කිරීම් සිදු කර නොතිබුණි. ඒ වෙනුවට සමාලෝචිත වර්ෂයේදී පාරිතෝෂික දීමනා (ව්‍යාපෘති කාර්ය මණ්ඩලය හැර) වශයෙන් ගෙවන ලද රු.578,942,828 කට සමාන වටිනාකමක් වර්ෂයේ වෙන් කිරීම් ලෙස හඳුනා ගෙන තිබුණි. | සෑම වර්ෂ තුනකට වරක් විශේෂඥයෙකුගේ සේවය ලබා ගැනීමෙන් මණ්ඩලය තුළ තක්සේරුකරණය සිදු කරනු ලැබේ. වර්ෂය තුළ ගෙවන ලද පාරිතෝෂික දීමනා, ප්‍රතිපාදන ලෙස මෙන්ම වර්ෂය සඳහා වියදමක් ලෙස ද හඳුනාගනු ලැබේ. | සේවක ප්‍රතිලාභ වගකීම් හඳුනා ගැනීම සහ අදාළ හෙළිදරව් කිරීම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19 (ශ්‍රී.ලං.ගි.ප්‍ර 19) සමඟ අනුකූල වන බවට සහතික විය යුතු වීම. |
| v. | රජයේ ප්‍රදාන ගිණුම්ගත කිරීම සහ රජයේ ආධාර හෙළිදරව් කිරීම පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (ශ්‍රී.ලං.ගි.ප්‍ර 20) විධිවිධානවලට පටහැනිව, වසර 8 සිට 12 දක්වා කාලයක් තුළ නොවෙනස්ව පැවති ව්‍යාපෘති 34 කට අදාළව එකතුව රු.මිලියන | ඉඩම් ඇතුළුව ක්ෂය නොකළ වත්කම්වලට අදාළ ප්‍රදාන කාලයක් තිස්සේ ක්ෂය නොකර පැවතුනි. එමෙන්ම පැවති ගොඩනැගිලිවල ආයු කාලය අවුරුදු 50 ඉක්මවනු | විදේශ ප්‍රදාන ක්‍රමක්ෂය කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ශ්‍රී.ලං.ගි.ප්‍ර 20) සමඟ අනුකූල වන බවට සහතික විය යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | 14,697.25 ක් වූ විදේශ ප්‍රදාන ශේෂයන් ක්‍රමක්ෂය කිරීමෙන් තොරව 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවලට ගෙන තිබුණි. මූල්‍ය ප්‍රකාශන සඳහා ක්‍රමක්ෂය නොකිරීමේ බලපෑම විගණනයේදී නිශ්චය කර ගත නොහැකි වූයේ එම විදේශීය ප්‍රදානවලට අදාළ තොරතුරු කිසිවක් නොමැති බැවිනි. | ලැබේ. එම කාල පරිච්ඡේදය දක්වා අදාළ ප්‍රදාන ක්ෂය කරන ලදි. | |
| vi. | විදේශ විනිමය අනුපාතයන් වෙනස්වීමේ බලපෑම් පිළිබඳව වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයේ (ශ්‍රී.ලං.ගි.ප්‍ර 21) ඡේද අංක 23 (අ) ට පටහැනිව එකතුව එ.ජ.ඩො.84,176,147 ක් වන එ.ජ.ඩො. ස්ථාවර තැන්පතු (පහක) 05 ක වටිනාකම සමාලෝචිත වර්ෂය අවසානයට වන අනුපාතයන් යොදා ගෙන මණ්ඩලය විසින් පරිවර්තනය කොට නොතිබුණි. එබැවින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ස්ථාවර තැන්පත් වටිනාකම ආසන්න වශයෙන් රු. මිලියන 159.09 කින් අවප්‍රමාණය වී තිබුණි. තවද, මූල්‍යමය අයිතමයන් පරිවර්තනය කිරීමෙන් පැනනගින අනුපාත වෙනස්වීම් ප්‍රමිතයේ ඡේද අංක 28 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනයන්හි හඳුනාගෙන නොතිබුණි. | මූල්‍ය වත්කම් මූලිකව හඳුනාගැනීමේදී, ගනුදෙනු දිනයේදී ක්‍රියාකාරී මුදල් සහ විදේශ මුදල් අතර ස්ථානීය විනිමය අනුපාතය අනුව විදේශ මුදල් ප්‍රමාණයට ස්ථානීය විනිමය අනුපාතය යෙදීමෙන් එය සටහන් කර තිබුණි. | විදේශ ව්‍යවහාර මූල්‍ය අයිතම වාර්තා කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 21 (ශ්‍රී.ලං.ගි.ප්‍ර 21) සමඟ අනුකූල වන බවට සහතික විය යුතු වීම. |
| vii. | ආයෝජන දේපල පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයේ (ශ්‍රී.ලං.ගි.ප්‍ර 40) විධිවිධාන වලට පටහැනිව, ධාරණ අගය රු.337,781,741 ක් වූ අයෝජන දේපළ 2019 දෙසැම්බර් 31 දිනට ආයෝජන දේපළ ලෙස දැක්වීම වෙනුවට දේපළ පිරියත හා උපකරණ ලෙස දක්වා තිබුණි. තවද, ප්‍රමිතියේ 75 (ඊ) (i) සහ 79 වගන්තිවලට අනුව, ආයෝජන දේපල වලින් ලැබෙන ආදායම හෙළිදරව් කර නොතිබූ අතර ක්ෂය කිරීමේ ක්‍රමය, ඵලදායී ජීවිත කාලය හෝ ක්ෂය වීමේ අනුපාතය, දළ ධාරණ වටිනාකම සහ කාල පරිච්ඡේදය ආරම්භක හා අවසාන දිනට සමුච්චිත ක්ෂය සහ අපහායන වටිනාකම ආදිය සම්බන්ධයෙන් මණ්ඩලය විසින් නිසි හෙළිදරව්කිරීම් සිදු කර නොතිබුණි. | ශ්‍රී.ලං.ගි.ප්‍ර 40 හි 14 වන ඡේදය අනුව ජල සම්පාදන අමාත්‍යාංශය දැනට පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල ආයෝජන දේපළ ලෙස හඳුනාගැනීම විනිශ්චය මත පදනම් වේ. එබැවින් ඉහත ප්‍රමිතයේ 75 (ඇ) ඡේදයට අනුව මූල්‍ය ප්‍රකාශනයේ එවැනි ගැලපීම් අවශ්‍ය නොවේ. | ආයෝජන දේපළ හඳුනාගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී.ලං.ගි.ප්‍ර 40) සමඟ අනුකූල වන බවට සහතික විය යුතු වීම. |

## 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | මීට වසර හතරකට පෙර කැලණිය ප්‍රාදේශිකයේ සොරකම් කරන ලද රු.2,549,787 ක තොග එම අලාභය අදාළ නිලධාරීන්ගෙන් අයකර ගැනීමෙන් තොරව 2019 දෙසැම්බර් 31 දිනට වූ තොගයට ඇතුළත් කර තිබුණි. | දැනට සිදුකෙරෙන පරීක්ෂණය අවසන් වූ පසු ගිණුම් පොත්වලින් කපා හැරීමට පියවර ගනු ලැබේ. | එවැනි තොග ශේෂයන් ගිණුම් පොත්වලින් ඉවත් කිරීමට පියවර ගත යුතු අතර වගකිවයුතු නිලධාරීන්ගෙන් අලාභ පියවා ගැනීමට කඩිනම් පියවර ගත යුතු වීම. |
| ii. | කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලයේ ජල සම්පාදන යෝජනා ක්‍රම 16 කට අදාළ එකතු වටිනාකම රු.65,852,393 ක් වූ ස්ථාවර වත්කම් භාවිතා කළ නොහැකි මට්ටමේ පවතින බවත් දිගු කාලයක් තිස්සේ ස්ථාවර වත්කම් ලෙස පවතින බව 2015 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේදී නිරීක්ෂණය කොට තිබුණි. කෙසේ වෙතත්, ඒවා ගිණුම් පොත්වලින් ඉවත් කිරීමට නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මෙම භාවිතයට ගත නොහැකි වත්කම් ගිණුම් පොත්වලින් කපා හැරීම සඳහා රු.65,852,393 කට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදී | භාවිතයට ගත නොහැකි වත්කම් බැහැර කර ගිණුම් පොත් වලින් ඉවත් කිරීමට පියවර ගත යුතු වීම. |
| iii. | සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනයන් අනුව නව සම්බන්ධතා ණයගැතියන් ඇතුළුව 2019 දෙසැම්බර් 31 දිනට වෙළඳ ණයගැති ශේෂය රු.4,866,811,132 ක් විය. කෙසේ වෙතත්, හානිකරණය සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇත්තේ රු.4,728,910,812 ක ණයගැතියන් සඳහා පමණි. එබැවින් එකතු වටිනාකම රු.137,900,320 ක ණයගැතියන් සඳහා වෙන්කිරීම් කර නොතිබුණි. | හානිකරණ ගණනය කිරීම වාණිජ පද්ධතිය විසින් ලබා දී ඇති සත්‍ය සංඛ්‍යා මත පදනම් වී ඇත. | ණයගැති හානිකරණ වෙන්කිරීමේ නිරවද්‍යතාවය පිළිබඳ සහතික විය යුතු වීම. |
| iv. | වටිනාකම රු.106,835,381 ක් වූ පිරිපහදු මධ්‍යස්ථානයට, ජලාශයට හා තුළුමුවට විදුලිබලය සැපයීමට සවිකර තිබූ ට්‍රාන්ස්ෆෝමර් තුනක් ඒ.ඩී.බී. (IV) ව්‍යාපෘතිය නිම කිරීම සමඟ මණ්ඩලයට පවරා තිබුණි. කෙසේ වෙතත්, මෙම වත්කම් වටිනාකම් සමාලෝචිත වර්ෂය අවසානයට වන මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම නොවන වත්කම් ලෙස දැක්වීමකින් තොරව සංචලන හා අනෙකුත් අත්තිකාරම් ලෙස දක්වා තිබූ අතර ඉහත වත්කම් සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්ෂය සඳහා වෙන්කිරීම් සිදු කර නොතිබුණි. | එය අදාළ ප්‍රාදේශිකයන් විසින් ලංකා විදුලි බල මණ්ඩලයේ තබා ඇති තැන්පත් වලට අදාළ වේ. | ගිණුම් පොත්වල සටහන් කර ඇති ස්ථාවර වත්කම්වල නිරවද්‍යතාවය සහ සම්පූර්ණ බව සහතික විය යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| v. | අම්පාර ප්‍රාදේශීය කාර්යාලයේ භෞතික සත්‍යාපන වාර්තාවලට අනුව මහඔය, සමන්තුරෙ, උහන සහ කොන්ඩුවට්ටුවාන පිරිවැය මධ්‍යස්ථානයන්ට අදාළ එකතු වටිනාකම රු.3,596,600 ක් වන ගොඩනැගිලි ආකෘතීන් සහ පිරියත හා උපකරණ භාවිතයෙන් ඉවත් කර තිබූ අතර රු.7,088,478 ක් වටිනා ව්‍යුහයන් කඩා දමා තිබුණි. කෙසේ වෙතත් එම වත්කම් අපහරණය සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය සඳහා රු.212,914 ක ක්ෂය ප්‍රතිපාදන සිදු කර තිබුණි. | රු 7,088,478 ක් වටිනා පිරියත ඉවත් කර ඇති අතර මණ්ඩල පත්‍රිකාවක් මගින් මෙම වත්කම බැහැර කිරීමට කටයුතු සිදුකරමින් පවතී. | ගිණුම් පොත්වල සටහන් කර ඇති ස්ථාවර වත්කම්වල නිරවද්‍යතාවය සහ සම්පූර්ණ බව සහතික විය යුතු වීම. |
| vi. | අම්පාර ප්‍රාදේශීය කාර්යාලයේ භෞතික සත්‍යාපන වාර්තාවට අනුව, එකතු වටිනාකම රු.46,361,081 ක වත්කම් භෞතිකව දැක ගත නොහැකි විය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ රු.946,602 ක ක්ෂය වෙන්කිරීම් සිදු කර තිබුණි. | සවිස්තරාත්මක පැහැදිලි කිරීම් වලට අනුව ඡේදයට එකඟ වේ. | ගිණුම් පොත්වල සටහන් කර ඇති ස්ථාවර වත්කම්වල නිරවද්‍යතාවය සහ සම්පූර්ණ බව සහතික විය යුතු වීම. |
| vii. | සමාලෝචිත වර්ෂයේ සඳහා සත්‍ය ආදායම් බදු වියදම හඳුනාගැනීමට සවිස්තර අදායම් බදු ගණනය කිරීමක් සිදු කිරීමකින් තොරව 2017 වර්ෂය තුළ ගෙවන ලද රු.65,383,426 ක ආර්ථික සේවා ගාස්තු (ආ.සේ.ගා) විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ ආදායම් බදු වියදම ලෙස වැරදියට හඳුනාගෙන තිබුණි. | ආර්ථික සේවා ගාස්තු (ආ.සේ.ගා) විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ වියදම් ලෙස පැහැදිලිව දක්වා ඇත. | විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ ආදායම් බදු වියදම්වල නිරවද්‍යතාවය සහතික විය යුතු වීම. |
| viii. | ලැබී ඇති තොරතුරු වලට අනුව, රු.1,133,341,195 ක් වටිනා නිම කර ජනතා අයිතියට පත් කරන ලද ජල සම්පාදන හා පුනරුත්ථාපන ව්‍යාපෘති පනස් පහක (55) පිරිවැය ප්‍රාග්ධනිත නොකර 2019 දෙසැම්බර් 31 දිනට කෙරීගෙන යන වැඩ තුළ පැවතුණි. තවද, නැවත අයකර ගැනීමේ වැඩ සඳහා ලද අත්තිකාරම් අතරින් කළුතර ප්‍රාදේශිකයට සහ බටහිර මධ්‍යම ප්‍රාදේශිකයට අයත් වටිනාකම රු.12,617,859 ක ව්‍යාපෘති 05 ක් මේ වන විටත් නිම කර තිබුණි. කෙසේ වෙතත් 2020 ජූනි 30 වන විටත් එය අදාල ආදායම් ගිණුමට ගෙන නොතිබුණි. | ප්‍රාග්ධනිත කිරීම සඳහා ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් වත්කම් ආකෘති එවිය යුතු වේ. තවද, නැවත අයකර ගැනීමේ ව්‍යාපෘති සම්බන්ධයෙන් සහතික කිරීම අවසන් වූ විගස මෙම ශේෂයන් නිරවුල් කිරීමට අදාළ ප්‍රවේශයන් සම්මත කර ගනු ඇත. | සම්පූර්ණ කරන ලද හා ජනතා අයිතියට පත් කරන ලද ජල සම්පාදන හා පුනරුත්ථාපන ව්‍යාපෘති ප්‍රාග්ධනිත ගත කිරීමටත් ව්‍යාපෘති අවසන් වීමෙන් පසුව නැවත අය කර ගැනීමේ වැඩ සඳහා ලද අත්තිකාරම් අදාළ ආදායම් ගිණුම්වලට බැර කිරීමටත් පියවර ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| ix. | 2016, 2017 සහ 2018 වර්ෂවලට අදාළව 2018 සහ 2019 වර්ෂවල මූල්‍ය ප්‍රකාශනයන්හි මණ්ඩලය විසින් පෙර වර්ෂයේ ගැලපුම් සිදු කර ඇති බව නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2018 වසර අවසානයට වූ සමුච්චිත අලාභය රු. මිලියන 117.96 කින් විකෘති වී තිබුණි. එබැවින්, ඉදිරි වර්ෂය තුළදී සමාලෝචිත වර්ෂයේ ලාභයට ගැලපීම් කිරීමට ඇති හැකියාව විගණනයේදී බැහැර කර නොහැක. සමාලෝචිත වර්ෂයේ සහ පෙර වර්ෂවල සිදු කරන ලද එවැනි පෙර වර්ෂයන්ට අදාළ ගැලපීම් පිළිබඳ විස්තර පහත දැක්වේ. | ශ්‍රී.ලං.ගි.ප්‍ර 08 ට අනුව පූර්ව වර්ෂයට අදාළ දෝෂ නිවැරදි කිරීම නියාමන අවශ්‍යතාවයකි. කෙසේ වෙතත්, පූර්ව වර්ෂයට සිදුකරන ලද ගැලපුම් 2019 වර්ෂයේදී රු.100,836,158 දක්වා අඩු කර ඇත. | භාවිතයක් ලෙස සිදු කරන පෙර වර්ෂයේ ගැලපීම් මගින් ලාභ විකෘති වීම වළක්වා ගැනීමට පියවර ගත යුතු වීම. |

| වර්ෂය | හර කළ වටිනාකම රු. | බැර කළ වටිනාකම රු. | සමුච්චිත ලාභයට අදාළ බලපෑම රු. |
|---|---|---|---|
| 2018 | 8,086,792 | 108,922,950 | 100,836,158 |
| 2017 | 18,821,712 | 140,160,044 | 121,338,332 |
| 2016 | 243,896,877 | 139,680,704 | (104,216,173) |

| | | | |
|---|---|---|---|
| x. | ව්‍යාපෘති හතක් (07) සම්බන්ධයෙන් කෙරීගෙන යන වැඩ යටතේ දැක්වෙන වටිනාකම රු.198,729,791 ක් වන ශේෂයන් මූල්‍ය ප්‍රකාශයන්හි අවශ්‍ය ගැලපුම් සිදු කිරීම සඳහා විමර්ශනය නොකර වසර දහයකට වඩා වැඩි කාලයක් නොවෙනස්ව පැවතුණි. | ප්‍රාග්ධනිත කිරීම සඳහා ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් වත්කම් ආකෘති එවිය යුතු වේ. | සම්පූර්ණ කරන ලද හා ජනතා අයිතියට පත්කරන ලද ජල සම්පාදන හා පුනරුත්ථාපන ව්‍යාපෘති ප්‍රාග්ධනිත කිරීමට පියවර ගත යුතු වීම. |
| xi. | නියැදි විගණන පරීක්ෂාවට අනුව ස්ථාවර තැන්පත් තුනකට (03) අදාළ පොලී ආදායම් ලැබීම් සහ ඊට අදාළව අඩුකරන ලද රඳවා ගැනීම් බදු වටිනාකම් වූ පිළිවෙලින් රු.15,302,077 ක් සහ රු.1,125,718 ක් ගිණුම් ගත කර නොතිබුණි. තවද, වටිනාකම එ.ජ.ඩො. 91,395.37 ක් වන එ.ජ.ඩො. තැන්පත් තුනකට (03) ලැබී තිබූ පොලිය රුපියල් අගයකට පරිවර්තනය කිරීමකින් තොරව ඩොලර් වටිනාකමින් මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර තිබුණි. එබැවින් පොලී ආදායම, ලැබිය යුතු රඳවා ගැනීම් බදු සහ බැංකු ශේෂයන් පිළිවෙලින් රු.15,619,025 ක්, රු.780,502 ක් සහ රු.14,838,523 කින් අවප්‍රමාණය වී තිබුණි. තවද, එ.ජ.ඩො. තැන්පතු හතරකට (04) අදාළ රු. මිලියන 137 ක උපචිත පොලී ආදායම් ගිණුම් පොත්වල වාර්තා කොට නොතිබුණි. ඊට අමතරව 2019 නොවැම්බර් 08 සිට 2019 දෙසැම්බර් 08 දක්වා කාලපරිච්ඡේදයට අදාළව | 2020 හිදී මෙම පොලී නිවැරදි කරනු ලැබේ. | ස්ථාවර තැන්පත්වලට අදාළ පොලී ආදායම් සම්බන්ධයෙන් අදාළ නිවැරදි කිරීම් ප්‍රවේශයන් සම්මත කර ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | වෙනත් තැන්පතුවක් සඳහා ලද පොලී ආදායම වන රු.3,457,862 ක් ගිණුම්ගත කර නොතිබුණි. | | |
| xii. | වෙනත් ස්ථාවර තැන්පතුවකට අදාළ උපචිත පොලී ආදායම වන රු.1,130,959 ක් දෙවරක් ගිණුම්ගත කොට තිබුණු අතර තවත් ස්ථාවර තැන්පතුවකට අදාළ රු.352,247 ක උපචිත පොලිය ගිණුම් ගත කොට නොතිබුණි. | නිවැරදි කිරීම ප්‍රවේශය 2020 වර්ෂයේදී සිදු කරනු ලැබේ. | ස්ථාවර තැන්පත්වලට අදාළ උපචිත පොලී ආදායම් සම්බන්ධයෙන් අදාළ නිවැරදි කිරීම් ප්‍රවේශයන් සම්මත කර ගත යුතු වීම. |
| xiii. | රු.71,040,247 ක් වන ලංකා බැංකු ස්ථාවර තැන්පතු වලින් ලැබිය යුතු පොලී ආදායමේ ආරම්භක ශේෂයෙන් රු.49,702,919 ක් පමණක් සමාලෝචිත වර්ෂය තුළ අයකර ගෙන තිබුණි. එබැවින් ඉතිරිව පවතින ශේෂය වූ රු.21,337,328 ක් සමාලෝචිත වර්ෂයේදී නිසි ලෙස හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | මෙය 2020 දී නිවැරදි කරනු ලැබේ. | ලැබිය යුතු පොලීහි ආරම්භක ශේෂයන් සමාලෝචිත වර්ෂයේදීම නිරවුල් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වීම. |
| xiv. | විදේශ මූල්‍යාන ව්‍යාපෘති දෙකකට (02) හා දේශීය බැංකු ණය ව්‍යාපෘති තුනකට (03) අදාළව බැංකුවෙන් ලද ශේෂ සනාථ කිරීම් මූල්‍ය ප්‍රකාශ තුළ ඇති ශේෂය සමඟ සංසන්දනය කිරීමේදී, මූල්‍ය ප්‍රකාශන අනුව හිඟ ණය ශේෂය රු.292,455,446 කින් වැඩියෙන් දක්වා තිබුණු බව නිරීක්ෂණය විය. තවද, බැංකුවෙන් ලද ශේෂ සනාථ කිරීම් සමඟ සංසන්දනය කිරීමේදී දේශීය මූල්‍යාන ව්‍යාපෘති නවයකට (09) අදාළ උපචිත බැංකු ණය පොලිය රු.7,558,250 ක් අධි ප්‍රතිපාදනය කර තිබූ බව නිරීක්ෂණය විය. | **පැකේජ (III), අම්පාර, කොළඹ නගර, ව්‍යාපෘති 22, මැදිරිගිරිය -** 2019 වර්ෂයේ සිදු කළ යුතු වුවත් 2020 වර්ෂයේදී සිදු කරනු ලැබූ රිසිට් පත හේතුවෙන් රු.419,100 ක වෙනසක් ඇත.<br><br>**අම්පාර දිස්ත්‍රික් බෙදාහැරීම් ජාල ජලසම්පාදන ව්‍යාපෘතිය -** 2020 ජනවාරියෙහිදී සිදු කරනු ලැබූ රිසිට් පතක් හේතුවෙන් රු.1,058,700 ක වෙනස ඇති වී ඇත.<br><br>**ලග්ගල නව නගර ජල සම්පාදන ව්‍යාපෘතිය -** බැංකුව විසින් හිඟ ණය ශේෂයට ගෙවිය යුතු පොලී වටිනාකමද එකතු කිරීම හේතුවෙන් මෙය සිදුවී ඇත.<br><br>**අලුත්ගම, මතුගම, අගලවත්ත ජල සම්පාදන ව්‍යාපෘතිය -** මූල්‍ය ප්‍රකාශනවලට අනුව | |

| | | | |
|---|---|---|---|
| | | වටිනාකම් ගණනයේදී විගණනය විසින් ලංකා බැංකු සහ ඉන්දියානු අපනයන ආනයන බැංකු වටිනාකම වැරදියට එකතු කර ඇත.<br><br>**හෙම්මාතගම ජල සම්පාදන ව්‍යාපෘතිය -** මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු.3,875,023,311 ක් වන අතර බැංකුව විසින් රු.3,772,862,944 ක් තහවුරු කර ඇත. තවද, පවත්නා වාර්තා අනුව 2019 වර්ෂයට උපචිත කළ යුතු ණය පොලිය රු.2,459,661,806 ක් වේ. | |
| xv. | අංක 02/2016 දරන රජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව රේඛීය අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියකින් තොරව මන්නාරම දිස්ත්‍රික්කයේ රු.758,840 ක ණයගැති ශේෂයක් කපා හැරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කර තිබුණි. කෙසේ වෙතත්, එම වටිනාකම වෙළඳ ණයගැතියන් වෙනුවට මනුගත විකුණුම් ගිණුමට බැර කොට තිබුණි. | මුදල් රෙගුලාසි සංග්‍රහයේ ඡේද 102 සිට 108 ප්‍රකාරව, වෙළඳ අලාභ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් කපා හැරිය හැක. | රජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධාන සමඟ දැඩිව අනුගත විය යුතු අතර ඒ අනුව අදාළ නිවැරදි කිරීම් සිදු කළ යුතු වීම. |
| xvi. | පසුගිය වර්ෂයන්හි අවිනිශ්චිත ගිණුමට අයකරන ලද වෙනත් ණයගැතියෝ, අත්තිකාරම්, වෙළඳ ණයහිමියෝ, ඉල්ලුම් නොකළ වේතන යනාදිය ඇතුලත්ව වී දීර්ඝ කාලීනව පැවත එන පිළිවෙලින් රු.149,681,812 ක් හා රු.72,141,419 ක වත්කම් හා වගකීම් ශේෂයන් සමාලෝචිත වර්ෂය තුළදී අදාළ ගිණුම්වලට අයකර තිබූ අතර එම ශේෂයන් නිරවුල් කිරීමට පියවර ගැනීමකින් තොරව ක්‍රියාකාරී නොවන වත්කම් හා ක්‍රියාකාරී නොවන වගකීම් ලෙස හඳුනාගෙන තිබුණි. තවද රු.95,796,513 ක හඳුනා නොගත් ශේෂයක් හා රු.5,906,882 ක බැංකු ශේෂයක් විමර්ශනය කොට නිරවුල් කිරීමට පියවර ගැනීමකින් තොරව ඉහත සඳහන් ශේෂය තුළ ක්‍රියාකාරී නොවන වත්කම් ලෙස පැවතුණි. | හස්තපොත් පද්ධතිය පරිගණකගත කරමින් තිබීම හේතුවෙන් මෙම ශේෂයන් 1999 වර්ෂයේ සිට පැවතෙමින් පවතී. | ක්‍රියාකාරී නොවන වත්කම් හා වගකීම් ශේෂයන් නිරවුල් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වීම. |

### 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | වව්නියාව, මඩකලපුව, කළුතර, පානදුර ප්‍රාදේශීය කාර්යාල හා සබරගමුව ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානයේ ස්ථාවර වත්කම් ලේඛන හා විගණනයට ඉදිරිපත් කරන ලද අනුරූප උපලේඛන අතර එකතුව රු.105,427,971 ක නිරපේක්ෂ වෙනසක් පැවතීම හේතුවෙන් සින්නක්කර ඉඩම්, සින්නක්කර ගොඩනැගිලි සහ විබෙදුම් යනාදී ස්ථාවර වත්කම් අයිතම තුනක (03) නිරවද්‍යතාවය හා සම්පූර්ණතාවය විගණනයට නිශ්චය කර ගත නොහැකි විය. | **සබරගමු ප්‍රාදේශිකය**<br>ඉඩම් අත්පත් කර ගැනීම අවසන් කොට නොමැත. එබැවින් ඒවා ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් වී නැත. නමුත් මෙම ඉඩම් වර්තමානයේදී මණ්ඩලය විසින් භාවිතා කරමින් පවතියි. එම නිසා එය මූල්‍ය ප්‍රකාශන තුළ ඉඩම් ලෙස දක්වා ඇත.<br><br>**පානදුර**<br>අවශ්‍ය ලේඛන ලබා ගැනීමෙන් පසුව මෙය ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කරනු ලැබේ.<br><br>**කළුතර**<br>2020 වර්ෂයේදී වෙනස්කම් නිවැරදි කරනු ඇත.<br><br>**මඩකලපුව** රු.4,896,791 ක වෙනස 2020 වර්ෂයේදී නිරවුල් කරනු ඇත. | ස්ථාවර වත්කම් ලේඛන අනුරූප උපලේඛන සමඟ සැසඳිය යුතු වීම. |
| ii. | පහත වෙනස්කම් නිරීක්ෂණය කරන ලදී.<br>**(අ) වෙළඳ ණය ගැතියෝ** (රු.)<br>මූල්‍ය ප්‍රකාශන අනුව 4,707,186,657<br>වයස් විශ්ලේෂණයට අනුව 4,567,497,570<br>වෙනස 139,689,087<br>**(ආ) නව සම්බන්ධතා ණය ගැතියෝ** (රු.)<br>මූල්‍ය ප්‍රකාශන අනුව 159,624,475<br>වයස් විශ්ලේෂණයට අනුව 63,934,575<br>වෙනස 95,689,900<br>**(ඇ)මනුගත විකුණුම් සහ තොග විකුණුම්** (රු.)<br>මූල්‍ය ප්‍රකාශන අනුව 23,995,638,648<br>කළමනාකරණ තොරතුරු වාර්තා අනුව 23,846,150,000<br>වෙනස 149,488,648 | (අ) සහ (ආ) වාණිජ පද්ධතිය සහ පොදු ලෙජර් පද්ධතිය අතර වෙනසක් පවතී.<br><br>(ඇ) වාණිජ අංශය විසින් ලබා දෙන ලද ඇස්තමේන්තුගත සංඛ්‍යා සහ සත්‍ය සංඛ්‍යා හේතුවෙන් වෙනස ඇති වී ඇත. | මූල්‍ය ප්‍රකාශවල ශේෂයන් සහ අනුරූප උපලේඛන සැසඳුම් කිරීම. |

| | | | |
|---|---|---|---|
| iii. | සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂණයට අනුව, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති කෙරීගෙන යන වැඩ ශේෂය සහ විදේශ මූල්‍යන ව්‍යාපෘති හතරක තනි මූල්‍ය ප්‍රකාශනයන්හි දැක්වෙන අනුරූප ශේෂයන් අතර එකතු වටිනාකම රු. මිලියන 431.5 ක වෙනසක් නිරීක්ෂණය විය. | ඇමුණුම් මගින් සැසඳුම් ඉදිරිපත් කර ඇත. | යටකී වෙනස්කම් නිවැරදිව සැසඳුම් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වීම. |
| iv. | බැංකු ගිණුම් හතරක් (04) සම්බන්ධයෙන් බැංකු සැසඳුම් ප්‍රකාශවල දක්වා ඇති පිළිවෙලින් රු.20,139,121 ක සහ රු.19,487,118 ක හඳුනානොගත් හර ශේෂයන් සහ බැර ශේෂයන් නිරවුල් කර නොතිබුණි. | හඳුනා නොගත් හර ශේෂය<br>බැර ශේෂය අතරින් රු.6,324,749 ක් 2020 දී නිරවුල් කර තිබූ අතර ඉතිරි ශේෂය නිරවුල් කිරීම සඳහා බැංකුවෙන් තොරතුරු ඉල්ලා ඇත. තවද, හඳුනා නොගත් හර ශේෂයන් 2020 දී නිරවුල් කරනු ඇත. | යටකී වෙනස්කම් සැසඳිය යුතු වීම. |
| v. | මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අදාළ ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශන සමඟ සංසන්දනය කිරීමේදී මහනුවර අපජල කළමනාකරණ ව්‍යාපෘතියේ සහ වියළි කලාපීය නාගරික ජල හා සනීපාරක්ෂක පහසුකම් ව්‍යාපෘතියේ විදේශ ප්‍රදානයන්හි එකතු වටිනාකම රු.මිලියන 12,243.47 ක වෙනසක් නිරීක්ෂණය විය. මහනුවර අපජල කළමනාකරණ ව්‍යාපෘතියේ රු. මිලියන 8,482.62 ක වෙනස අතරින් රු.මිලියන 8,425.68 ක වෙනස සඳහා පමණක් හේතුන් විගණනයට ඉදිරිපත් කෙරුණි. තවද, වියළි කලාපීය නාගරික ජල හා සනීපාරක්ෂක පහසුකම් ව්‍යාපෘතියේ ගිණුම්ගත කිරීමේ වැරදි හේතුවෙන් සිදුවූ රු. මිලියන 3,760.86 ක වෙනස මණ්ඩලයේ ගිණුම් පොත් තුළ 2020 මාර්තු 30 දින වන විටත් නිවැරදි කර නොතිබුණි. | මහනුවර අපජල කළමනාකරණ ව්‍යාපෘතිය<br>මෙම ව්‍යාපෘතියේ ප්‍රදාන ගිණුම, මහනුවර උතුර පාතදුම්බර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියේ ප්‍රදාන කොටස සමඟ ගිණුම් තැබීම හා ව්‍යාපෘතියේ දේශීය ප්‍රදාන මෙම ගිණුමේම ගිණුම් තැබීම හේතුවෙන් වෙනස ඇති වී ඇත.<br><br>වියළි කලාපීය නාගරික ජල හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය<br>පිටපත් කිරීමේ වැරදි හේතුවෙන් වූ වෙනස්කම් 2020 වර්ෂයේදී නිවැරදි කරනු ඇත. | |

### 1.5.4 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 වර්ෂයෙන් පසුව ආරම්භ කරන ලද ව්‍යාපෘති වෙනුවෙන් ලබාගෙන තිබූ රු.85,106,439,687 ක හිඟ ණය ශේෂය 2015 වර්ෂයේ සිට රජයේ ස්කන්ධ ගිණුමට මාරු කර තිබුණි. කෙසේ වෙතත්, මහා භාණ්ඩාගාරයේ වාර්තා අනුව මණ්ඩලය වෙනුවෙන් ගෙවිය යුතු ණය වශයෙන් රු.59,348,887,214 කට සමාන මුදලක් පමණක් ප්‍රාග්ධනිත ගත කර තිබුණි. එබැවින් විදේශ ණය ලෙස මණ්ඩලය විසින් ගෙවිය යුතු රු.25,757,552,473 කට සමාන වටිනාකමක් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ජෙනරාල්වරයාගේ අංක පීඊ/ ඩබ්ලිව්එස්/ එන්ඩබ්ලිව්එස්ඩීබී/ ජීඊඑන්/ 2015 දරන හා 2015 ජූලි 08 දිනැතිව නිකුත් කළ නියමයන්ට හා 2016 පෙබරවාරි 04 දින ගන්නා ලද කැබිනට් තීරණයන්ට පටහැනිව, රජයේ ස්කන්ධයට මාරු කර තිබුණි. | රජය විසින් ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණයක් හේතුවෙන් ණය ස්කන්ධයට පරිවර්තනය කරන ලදී. | රජයේ ස්කන්ධය ලෙස මාරු කරන ලද ශේෂය මහාභාණ්ඩාගාරය සමඟ සැසඳුම් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වීම. |

### 1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---:|---|---|---|
| (අ) | නව සම්බන්ධතා ණය ගැතියන් | 156,043,490 | විස්තරාත්මක උපලේඛන සහ වයස් විශ්ලේෂණය | (අ), (ඇ), (ඈ), (උ), (ඌ), (ඒ) සහ (ඔ) - රජයේ විගණනයට ඉදිරිපත් කරන ලදී. | (i) ඒ ඒ ණය ගැති සහ ණය හිමි, සේවක ණය සහ අත්තිකාරම් වල විස්තරාත්මක උපලේඛන, දත්ත පද්ධතියක් තුළ ඇතුළත් පවත්වා ගෙන යාමට පියවර ගත යුතු වීම. |
| (ආ) | විශේෂ ප්‍රසාද දීමනා සහ උත්සව අත්තිකාරම් | 1,211,506 | විස්තරාත්මක උපලේඛන | (ආ) 1999 දී ලබා දුන් රු.10,529,933 ක විශේෂ අත්තිකාරම්, සේවකයින් විශ්‍රාම යන විට අය කර ගත යුතු වේ. | |
| (ඇ) | ආපදා ණය, වාහන ණය හා වෙනත් සේවක ණය | 16,446,209 | විස්තරාත්මක උපලේඛන | (ඉ) මණ්ඩලයේ අතිවිශාල තොග පදනමක් ඇති බැවින් වයස් විශ්ලේෂණයක් සකස් කිරීමට නොහැකිය. | (ii) විස්තරාත්මකව බදු ගණනය කිරීමකින් පසුව වියදම ආදායම් ප්‍රකාශයේ හඳුනාගත යුතු වීම. |
| (ඈ) | වෙනත් ණය ගැතියන් | 78,817,838 | විස්තරාත්මක උපලේඛන | | (iii) මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කිරීමට පෙර කල් බදු ණය හිමියන්ගේ ශේෂ සනාථ කිරීම් ලබාගත |
| (ඉ) | චලනය නොවන හා සෙමින් චලනය වන තොග | 1,039,566,195 | වයස් විශ්ලේෂණය | (ඊ) ඉදිරිපත් නොකළ වාර්තා තවමත් | |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඊ) | දේපළ, පිරියත සහ උපකරණ | 53,226,240,081 | ස්ථාවර වත්කම් ලේඛන සහ සත්‍යාපන වාර්තා | පිළියෙල වෙමින් පවතී. | යුතු වීම. |
| (උ) | වෙළඳ ණය හිමියන් | 68,854,475 | විස්තරාත්මක උපලේඛන | (එ) 2019/ 2020 වර්ෂය සඳහා බදු ගණනය කිරීම 2019 නොවැම්බර් 30 දින දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට නියමිතය. | (iv) සම්පූර්ණ කරන ලද සියලුම උපලේඛන මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනයට ඉදිරිපත් කළ යුතු වීම. |
| (ඌ) | වෙනත් ණය හිමියන් | 332,650,903 | විස්තරාත්මක උපලේඛන | | |
| (එ) | බදු වියදම | 65,383,426 | වර්ෂයේ විස්තරාත්මක ආදායම් බදු ගණනය කිරීම. | | (v) මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට පෙර භාණ්ඩ සමීක්ෂණය අවසන් කළ යුතු වීම. |
| (ඒ) | කල්බදු ණය හිමියෝ | 3,190,775 | බැංකු සනාථ කිරීම් | | (vi) සියලුම යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛන විගණනයට ඉදිරිපත් කළ යුතු වීම. |
| (ඔ) | වෙනත් ආයතනවල තබා ඇති කෙටිකාලීන තැන්පත් | 13,211,058 | විස්තරාත්මක උපලේඛන | | (vii) පසු විපරම් ක්‍රියාමාර්ග ගැනීමට කෙටි කාලීන තැන්පතුවන්හි සවිස්තරාත්මක උපලේඛන ක්‍රමවත්ව පවත්වා ගත යුතු වීම.<br><br>(viii) අතිරික්ත අයිතම හඳුනාගැනීමට සෙමින් චලනය වන සහ චලනය නොවන අයිතමයන්හි වයස් විශ්ලේෂණය පිළියෙල කළ යුතු වීම. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු දෑ

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | එකතුව රු. මිලියන 1,392 ක් වූ වෙළඳ ණයගැතියන්, නව සම්බන්ධතා ණයගැතියන්, මලපවාහන ණයගැතියන් සහ වෙනත් ණයගැතියන් ආපසු අයකර නොගෙන වසර දෙකකට වැඩි කාලයක් පැවතුණි. එයින් සියයට 54 ක් කොළඹ, කැලණිය, කෝට්ටෙ සහ දෙහිවල ප්‍රාදේශිකයන් නියෝජනය කරනු ලබයි. | රතු දැන්වීම් යැවීම, ජලය විසන්ධි කිරීම සහ නීතිමය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම යනාදිය මගින් හිඟ ශේෂයන් අය කර ගැනීම සඳහා අයකර ගැනීමේ ක්‍රියාවලිය අඛණ්ඩව ක්‍රියාත්මක වේ. | ණය ගැතියන්ගෙන් නියමිත මුදල අයකර ගැනීමට ප්‍රමාණවත් හා අවශ්‍ය පියවර ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| ii. | අමාත්‍ය නිල නිවාස ජල සම්බන්ධතා 17 කට අදාලව රු.3,637,204 ක් අයකර නොගෙන සමාලෝචිත වර්ෂය අවසානයට පැවතුණි. එයින් රු.2,268,899 ක් වසර දෙකකට වඩා වැඩි කාලයක් අයකර නොගෙන පැවතුණි. | එය අයකර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගත්තද තවමත් සිදුවෙමින් පවතී. | අමාත්‍ය නිල නිවාසවලින් හිඟ ශේෂ අයකර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමට පියවර ගත යුතු වීම. |
| iii. | විසන්ධි කළ ණය ගැතියන්ගේ වයස් විශ්ලේෂණය අනුව රු.1,328,616,496 කට සමාන මුදලක් 2019 දෙසැම්බර් 31 දිනට හිඟව පැවති අතර ඉන් සියයට 88 ක් ගෘහස්ථ, පොදු කරාම සහ වාණිජ ආයතනයන් පමණක් නියෝජනය කරනු ලබයි. තවද, ඉහත ශේෂයෙන් සියයට 79 කට සමාන රු.1,049,623,385 ක මුදලක් වසර දෙකකට වැඩි කාලයක් හිඟව පැවතුණි. | විසන්ධි කළ හිඟ ශේෂය සඳහා නීතිමය අයකර ගැනීමේ ක්‍රියාවලිය අඛණ්ඩව සිදුවෙමින් පවතී. කෙසේ වෙතත්, අනාගතයේදී කපා හැරීමට සිදුවන හඳුනාගත් අය කර ගත නොහැකි හිඟයක් පවතී. | අයකර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා පියවර ගත යුතු වීම. |
| iv. | අහඹු ලෙස තෝරාගත් රු.246,674,502 ක වාණිජ අංශයේ සහ රාජ්‍ය අංශයේ ණය ගැතියන් සඳහා සෘජුවම ශේෂ තහවුරු කිරීම් කැඳවා ඇති අතර රු.2,821,503 ක් වන ණය ගැතියන් තහවුරු කිරීම් සමඟ එකඟ වන අතර රු.1,020,080 ක් වන ණය ගැතියන් තහවුරු කිරීම් සමඟ එකඟ නොවීය. 2020 ජූලි 30 දින දක්වා රු.242,832,919 ක් වූ ණයගැතියන් සම්බන්ධයෙන් තහවුරු කිරීම් ලැබී නොතිබුණි. | මණ්ඩලයේ ණයගැතියන්ගෙන් තහවුරු කිරීම කැඳවා ඇති අතර ඔවුන්ගේ තහවුරු කිරීම් සෘජුවම විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත එවන ලෙස උපදෙස් දී ඇත. | පවත්නා පාරිභෝගික දත්ත පද්ධතියේ නිරවද්‍යතාවය සමාලෝචනය කිරීමට පියවර ගත යුතු වීම. |
| v. | මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව ශ්‍රී ජයවර්ධනපුර රෝහලෙන් රු.7,712,773 ක් අයකර ගත යුතුව පැවතුණි. කෙසේ වෙතත්, ශ්‍රී ජයවර්ධනපුර රෝහලේ මූල්‍ය ප්‍රකාශන අනුව එය රු.2,201,854 ක් ලෙස දක්වා තිබුණි. | අදහස් දක්වා නොමැත. | පවත්නා පාරිභෝගික දත්ත පද්ධතියේ නිරවද්‍යතාවය සමාලෝචනය කිරීමට පියවර ගත යුතු වීම. |
| vi. | ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානය (මධ්‍යම) මගින් 2003 වර්ෂයේ සිට 2008 දක්වා කොන්ත්‍රාත්කරුවන්ට දුන් එකතු වටිනාකම රු.8,177,506 ක් වන අත්තිකාරම් සහ ප්‍රධාන කාර්යාලය විසින් 2009 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා ප්‍රධාන කාර්යාලය දෙනු ලැබූ රු.26,103,612 ක අත්තිකාරම් අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මධ්‍යම ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානයේ අත්තිකාරම් සඳහා මණ්ඩලයේ නීති නිලධාරීගේ තොරතුරු ලබා ගැනීමෙන් පසුව නීතිමය ක්‍රියාමාර්ග ගනු ලැබේ. | දීර්ඝ කාලීනව හිඟ හිටි අත්තිකාරම් අයකර ගැනීම සඳහා ප්‍රමාදයකින් තොරව නීතිමය ක්‍රියාමාර්ග ගත යුතු වීම. |
| vii. | මාර්ග සංවර්ධන අධිකාරිය, කොළඹ මහ නගර සභාව, ප්‍රාදේශීය මාර්ග සංවර්ධන අධිකාරිය සහ නගර සභා ඇතුළු බාහිර ආයතනවල තැන්පත් කර ඇති එකතුව රු.47,430,495 ක් වන කෙටිකාලීන තැන්පතු අයකර නොගෙන වසර තුනක් තිස්සේ හිඟව පැවතුනි. තවද, රේඛීය අමාත්‍යාංශයේ තබා | මුදල් ආපසු ගැනීම සඳහා ක්‍රියාමාර්ග කිහිපයක් ගත් නමුදු අවශ්‍ය ලේඛන නොමැති වීමෙන් ඒවා අයකර ගැනීමට නොහැකි විය. නුදුරු අනාගතයේදී | බාහිර ආයතනවල තබා ඇති තැන්පත් සම්බන්ධයෙන් අයකර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමට පියවර ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | තිබූ රු.4,378,828 ක් වන අත්තිකාරම් වසර හතකට වඩා වැඩි කාලයක් අයකර නොගෙන හිඟව පැවති අතර විස්තරාත්මක තොරතුරු නොමැති වීම හේතුවෙන් විගණනයට ඒ පිළිබඳව සතොයක්ෂණය කරගත නොහැකි විය. | තවදුරටත් ක්‍රියාමාර්ග ගනු ඇත. | |
| viii. | වටිනාකම පිළිවෙලින් රු.මිලියන 1,078.80 ක් (මහනුවර අපජල ව්‍යාපෘතියේ රඳවා ගැනීම් හැර) හා රු. මිලියන 3.19 ක් වන කොන්ත්‍රාත්කරුවන්ගේ රඳවා තබා ගැනීම් සහ ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු අදාළ පාර්ශවයන්ට නිදහස් කිරීමකින් හෝ ඒවා ආදායම් ලෙස සැලකිල්ලට ගැනීමකින් තොරව වසර තුනකට වඩා වැඩි කාලයක් පැවතුනි. තවද, එම රඳවා ගැනීම් සහ තැන්පතුවලට අදාළ කොන්ත්‍රාත්තු අවසන් වී ඇත්දැයි තහවුරු කර ගැනීම සඳහා විගණනයට කිසිදු සාක්ෂියක් ඉදිරිපත් නොවීය. | කොන්ත්‍රාත්කරුවන්ගේ ඉල්ලීම මත පදනම්ව පමණක් ව්‍යාපෘති නිමවීමෙන් පසුව මණ්ඩලය විසින් අදාළ කොන්ත්‍රාත්කරුවන්ට රඳවා ගැනීම් නිදහස් කරනු ඇත. නිශ්චිත කාල සීමාවකින් පසුව ඉල්ලීම් නොකරන ලද රඳවා ගැනීම් වටිනාකම අදායම් ලෙස සලකනු ලැබේ. | කොන්ත්‍රාත්කරුවන්ගේ රඳවා ගැනීම් හා ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පත්වල නොවෙනස් වී පවතින ශේෂයන් විමර්ශනය සඳහා පියවර ගත යුතු වීම සහ ඒවා නිරවුල් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වීම. |

**1.6.2 ගෙවිය යුතු දෑ**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | රු.35,519,035 ක් වූ අනෙකුත් ණය හිමි ශේෂය වසර 03 කට වඩා වැඩි කාලයක සිට නිරවුල් කර නොතිබුණි. තවද, මණ්ඩලය වෙනත් ණය හිමියන්ගේ නිසි දත්ත පද්ධතියක් පවත්වා ගෙන නොතිබූ බැවින් ඔවුන්ගේ වටිනාකම තහවුරු කිරීම් මඟින් සතොයක්ෂණය කර ගත නොහැකි විය. | කාර්යක්ෂමතාවය වර්ධනය කරනු ලබන පුද්ගලික ණය හිමියන්ගේ දත්ත පද්ධතියක් තුළ පවත්වා ගැනීම සඳහා උප ලෙජර් පද්ධතියක් වැඩිදියුණු කිරීමට නුදුරු අනාගතයේදී සැලසුම් කරනු ලැබේ. | වර්ගීකරණ දෝෂයන් මඟහරවා ගැනීමට දත්ත පවත්වා ගැනීම සඳහා උපලෙජර පද්ධතිය හඳුන්වාදීම කඩිනම් කිරීමට පියවර ගත යුතු වීම. |
| ii. | ප්‍රාදේශික 07 ක් තුළ නිරවුල් නොකළ රු.94,822,485 ක් වූ ණය හිමි පාලන ගිණුමේ ශේෂය 2019 දෙසැම්බර් 31 දින වන විටත් වසර තුනකට වැඩි කාලයක් පවතින බව නිරීක්ෂණය විය. | ණය හිමියන්, ඔවුන්ගේ ඉල්ලීම මත නිරවුල් කරනු ලැබේ. | ණය හිමි දත්ත පද්ධතියේ නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතු වීම. |

### 1.6.3 අත්තිකාරම්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | ගාලු ප්‍රදේශයේ අපජල අපහරණ කිරීමේ ව්‍යාපෘතිය යටතේ අපජල පවිත්‍රාගාරයක් ඉදිකිරීම සඳහා මණ්ඩලය විසින් ඉඩමක් මිලදී ගෙන තිබූ අතර තක්සේරු දෙපාර්තමේන්තුව විසින් මෙම ඉඩම රු. මිලියන 71.5 කට තක්සේරු කර තිබුණි. මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ නීති නිලධාරීගේ නිර්දේශය මත ඉඩමෙහි වටිනාකමින් සියයට 30 ක ප්‍රතිශතයකට සමාන රු.මිලියන 21.25 ක් අත්තිකාරම් ලෙස 2014 අප්‍රේල් මාසයේදී ඉඩම් අයිතිකරුට ගෙවා තිබුණි. කෙසේ වෙතත්, ඉඩමේ අයිතිය සම්බන්ධයෙන් පසුව ඇතිවූ මතභේදයක් හේතුවෙන් ගෙවන ලද අත්තිකාරම් නැවත අයකර ගැනීමට අධිකරණ නඩුවක් ගොනුකර තිබුණි. කෙසේ වෙතත්, දැනටමත් පවුල් කිහිපයක් විසින් ඉඩම අත්පත් කර ගෙන ඇති අතර, අත්තිකාරම් ලබා ගැනීමෙන් පසුව අයිතිකරු විසින් ඉඩමෙන් පස් ඉවත් කරගෙන තිබුණි. ගෙවන ලද අත්තිකාරම සහ ඒ මත වන දඩ මුදල් ඉඩමේ අයිතිකරුගෙන් හෝ මණ්ඩලයේ වගකිව යුතු නිලධාරීන්ගෙන් 2020 ජූලි 31 දිනටත් අයකර ගෙන නොතිබුණි. | ගෙවන ලද අත්තිකාරම් අයකර ගැනීම සඳහා වෙනම පරීක්ෂණයක් නීති අංශය විසින් සිදු කරගෙන යනු ලබන අතර අයිතිකරුගෙන් රු.මිලියන 21.45 ක් අයකර ගැනීමට නඩුවක් ගොනු කර ඇත. ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වගන්තිය ප්‍රකාරව ඉඩම භාවිතා කිරීමේ අයිතිය ප්‍රාදේශීය ලේකම් විසින් පවරා ගෙන ඇත. | ගෙවන ලද අත්තිකාරම් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතු වීම හා වගකිව යුතු පුද්ගලයන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගත යුතු වීම. |

### 1.6.4 අවිනිශ්චිත ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශුද්ධ වටිනාකම රු.793,388,346 ක් වූ මණ්ඩලයේ වත්කම් වගකීම් හා ස්කන්ධ ශේෂයන් විමර්ශනය කිරීමට පියවර ගැනීමකින් තොරව 2016,2017 සහ 2018 වර්ෂයන් වලදී අවිනිශ්චිත ගිණුමට මාරු කර තිබුණි. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය තුළදී එම ශේෂයන් නිරවුල් කිරීමට පියවර ගැනීමකින් තොරව එම ගිණුම් යලි දක්වා තිබුණි. තවද, සමාලෝචිත වර්ෂය අවසානයට රු.46,048 ක අවිනිශ්චිත ගිණුම් ශේෂයක් නිරවුල් කිරීමෙන් තොරව ගිණුම්වල පැවතුණි. | අවිනිශ්චිත ගිණුම් ශේෂය නිරවුල් කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීමට වැඩ සටහනක් ආරම්භ කරමින් සිටියි. හස්ත ගිණුම් පද්ධතිය පරිගණකගත කරමින් තිබීම හේතුවෙන් මෙම ශේෂයන් 1999 වර්ෂයේ සිට පැවතෙමින් පවතී. | අවිනිශ්චිත ගිණුම නිරවුල් කිරීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතු වීම. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | සාමාන්‍යාධිකාරී චක්‍රලේඛ | | | |
| i. | 2015 අගෝස්තු 12 දිනැති පා/ 12/2015 | විසන්ධි කිරීමෙන් මාස 03 ක් ඇතුළත හිඟ ණය ශේෂ අයකර ගැනීම සඳහා නීතිමය පියවර ගත යුතු වේ. කෙසේ වෙතත්, බිල්පත් වටිනාකම රු.50,000 ඉක්මවන එකතු වටිනාකම රු.481,739,086 ක් වන විසන්ධි කරන ලද ණය ගැතියන් 2089 කට අදාළව හිඟ ණය ශේෂ අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අතිවිශාල පාරිභෝගික පදනමක් පැවතීම හේතුවෙන් අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට සැලකිය යුතු කාලයක් ගත වේ. | සාමාන්‍යාධිකාරී චක්‍රලේඛ සමඟ දැඩිව අනුගත වන බව සහතික විය යුතු වීම. |
| ii. | 2018 සැප්තැම්බර් 26 දිනැති අංක පා/09/2018 දරන චක්‍රලේඛයේ ඡේද අංක (02) | වසර 5කට වඩා නිල නිවාසවල පදිංචි සේවකයින්ගේ වැටුපෙන් ආර්ථික කුලිය සහ සියයට 12.5 ක අධිභාරයකට සමාන මාසික කුලියක් අය කළ යුතු වේ. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය සඳහා වසර පහකට වඩා වැඩි කාලයක් නිල නිවාසවල පදිංචි වී සිටි ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානය (දකුණ) සේවකයින් 17 දෙනෙකුගෙන් රු.2,326,566 ක් සහ 2018 සැප්තැම්බර් සිට 2019 දෙසැම්බර් දක්වා මොනරාගල කළමනාකරණ කාර්යාලයේ සේවකයින් 04 දෙනෙකුගෙන් රු.656,732 ක දඩ කුලිය (අධිභාරය ඇතුළු කුලිය) 2020 ජූලි 31 දින දක්වා අයකර ගෙන නොතිබුණි. | දඩ මුදල් සමඟ වෙළඳපොළ කුලිය අයකර ගැනීම එක් එක් සිද්ධිය අනුව සිදුකරගෙන යනු ලබයි. | සාමාන්‍යාධිකාරී චක්‍රලේඛ සමඟ දැඩිව අනුගත වන බව සහතික විය යුතු වීම. |
| (ආ) | 2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | මණ්ඩලයේ බඳවා ගැනීම් හා උසස්කිරීම් පටිපාටිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | බඳවා ගැනීමේ පටිපාටිය පිළියෙල කිරීම තවමත් සිදුවෙමින් පවතින අතර එය විධිමත් කර ගැනීම සඳහා අදාළ පාර්ශවයන්ගේ නිර්දේශයන් කැඳවා ඇත. | කළමනාකරණ සේවා චක්‍රලේඛ සමඟ දැඩිව අනුගත වන බව සහතික විය යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| i) | මුදල් රෙගුලාසි 770 | රු.29,180,175 ක් වටිනා යල් පැන ගිය තොග බැහැර කිරීමට පියවර නොගෙන එය 2019 මූල්‍ය ප්‍රකාශය තුළ තොගය ලෙස ඇතුළත් කර තිබුණි. | අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසුව යල් පැන ගිය තොග බැහැර කරනු ලැබේ. | මූල්‍ය රෙගුලාසි සමඟ අනුගත වන බව සහතික විය යුතු වීම. |
| ii) | මුදල් රෙගුලාසි 756 | 2019 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණය 2020 ජූලි 31 වන විටත් අවසන් කර නොතිබුණි. | කොවිඩ් 19 වසංගතය හේතුවෙන් භාණ්ඩ සමීක්ෂණය ප්‍රමාද වුවද පසුව එය සම්පූර්ණ කරන ලදී. | මූල්‍ය රෙගුලාසි සමඟ අනුගත වන බව සහතික විය යුතු වීම. |
| iii) | මුදල් රෙගුලාසි 396 | රු.24,081,457 ක් වටිනා මාස හයකට වැඩි කාලයක් ඉදිරිපත් නොකර පැවතුණු චෙක්පත් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | 2020 දී නිරවුල් කරන ලදී. | මූල්‍ය රෙගුලාසි සමඟ දැඩිව අනුගත වන බව සහතික විය යුතු වීම. |
| (ඈ) | 2017 පෙබරවාරි 15 දිනැති අංක 1/2017 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය | විදේශ මූල්‍යන යටතේ ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති සඳහා එක් අභ්‍යන්තර විගණකවරයෙකු පමණක් පත්කර තිබුණි. | විදේශ මූල්‍යන ව්‍යාපෘති සඳහා අභ්‍යන්තර විගණකවරුන් බඳවා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අද වන විටත් අනුමැතිය ලබා දී නැත. | කළමනාකරණ විගණන චක්‍රලේඛ සමඟ දැඩිව අනුගත වන බව සහතික විය යුතු වීම. |
| (ඉ) | 2016 පෙබරවාරි 12 දිනැති අංක 02/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | යාපනයේ පොදු ජල කණු සම්බන්ධතාවලට අදාළ රු.5,390,596 ක ලැබිය යුතු ශේෂය භාණ්ඩාගාර අනුමැතියකින් තොරව කපා හැර තිබුණි. | මෙම ශේෂය කපා හැරීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ සමඟ දැඩිව අනුගත වන බව සහතික විය යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| (ඊ) | 2015 මැයි 25 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | | |
| i) | ඡේද අංක 02 | මණ්ඩලයේ සභාපති, උපසභාපති හා ක්‍රියාකාරී අධ්‍යක්ෂකවරයාට වාහන දෙක බැගින් වෙන්කර තිබුණි. | අවශ්‍යතාවය මත පදනම්ව අංශ සඳහා වාහන වෙන්කර ඇත. | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ සමඟ දැඩිව අනුගත වන බව සහතික විය යුතු වීම. |
| ii) | ඡේද අංක 3.1 | සභාපති, උපසභාපති හා ක්‍රියාකාරී අධ්‍යක්ෂක වෙනුවෙන් වෙන් කර ඇති වාහන සඳහා ඉන්ධන වියදම් ලෙස අනුමත සීමාවන් ඉක්මවා රු.1,590,251 ක් 2019 ජනවාරි සිට 2019 අගෝස්තු දක්වා වැය කොට තිබුණි. තවද, දකුණ ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානයෙහි නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීගේ හා සහකාර සාමාන්‍යාධිකාරීගේ ඉන්ධන වියදම් සඳහා රු.463,427 ක් 2019 ජනවාරි සිට 2019 ඔක්තෝම්බර් දක්වා වැය කර තිබුණි. | දරන ලද වියදම අධ්‍යක්ෂ පත්‍රිකාවක් මඟින් ආවරණය වනු ඇත. | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ සමඟ දැඩිව අනුගත වන බව සහතික විය යුතු වීම. |
| (උ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තිය | 2019 දෙසැම්බර් 31 දින වන විට මණ්ඩලය විසින් රේඛීය අමාත්‍යාංශයට මුදාහරින ලද සේවකයින් දහඅට දෙනෙකුගේ (18) වැටුප් හා දීමනා වශයෙන් රු. මිලියන 22.03 ක් සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණි. ඒ අනුව 2015 දෙසැම්බර් සිට 2019 දෙසැම්බර් 31 දක්වා නිදහස් කරන ලද සේවකයින් වෙනුවෙන් රු. මිලියන 168.45 ක් ජල සම්පාදන අමාත්‍යාංශය විසින් මණ්ඩලයට ප්‍රතිපූර්ණය කළ යුතුය. | අමාත්‍යාංශ ලේකම් විසින් ඉල්ලීම් ඉදිරිපත් කළ විට තාවකාලික පදනම මත ඔවුන් අමාත්‍යාංශයට නිදහස් කරනු ලබයි. කෙසේ වෙතත්, වැටුප් ප්‍රතිපූර්ණය කිරීම සඳහා අයවැය ප්‍රතිපාදන ඔවුන් සතුව නොවන බව අමාත්‍යාංශය විසින් දැනුම් දී ඇත. | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ සමඟ දැඩිව අනුගත වන බව සහතික විය යුතු වීම. |
| (ඌ) | ගම්පහ, අත්තනගල්ල සහ මීනුවන්ගොඩ ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුමෙහි 2 වන පරිච්ඡේදයේ 3.1,18.15 (ඇ) කොටස | ලබාදෙන ලද ණයවලින් රු.මිලියන 15,273.76 ක් 2019 ඔක්තෝම්බර් 08 වන දින එක්සත් ජනපද ඩොලර් තැන්පත් ගිණුම් පහක (05), ආයෝජනය කර තිබුණි. | අරමුදල් උපයෝජනයේ කාර්යක්ෂමතාවය වැඩි කිරීම සඳහා වගකීම් පැනනගින තෙක් අතිරික්ත අරමුදල් කෙටිකාලීන ආයෝජනයන් ලෙස ආයෝජනය කර ඇත. | |

| | | | | |
|---|---|---|---|---|
| (එ) | ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| i) | XIX ඡේදයේ 5 වන වගන්තිය | නියැදි විගණන පරීක්ෂාවට අනුව මාතර, ගාල්ල, හම්බන්තොට සහ මොනරාගල කළමනාකරණ කාර්යාල සහ මධ්‍යම ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානයට අදාළව සේවක නිල නිවාස 109 කින් රු.125 සිට රු.1000 දක්වා පමණක් වූ පරාසයක මාසික කුලියක් අයකරන බව නිරීක්ෂණය විය. | නිල නිවාස කුලිය ප්‍රමාණය සහ වර්ගය මත පදනම්ව වෙනස් වේ. | ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන සමඟ අනුගත වන බව සහතික විය යුතු වීම. |
| ii) | XIX ඡේදයේ 4.1 වගන්තිය | මාතර, මොනරාගල කළමනාකරණ කාර්යාල හා මධ්‍යම ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානයේ සේවක නිල නිවාස පහක පිටස්තර පුද්ගලයින් පස්දෙනෙකු විසින් පදිංචි වී තිබුණි. | නාමික කුලියක් මත පදනම්ව සුදුසුකම්ලත් සේවකයින් සඳහා පවුල් නිල නිවාස දෙනු ලැබේ. | ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන සමඟ අනුගත වන බව සහතික විය යුතු වීම. |
| (ඒ) | එෆ්අයිඩීඅයිසී මාර්ගෝපදේශයේ 14.6 වගන්තිය (ඉදිකිරීම් සඳහා වන කොන්ත්‍රාත් කොන්දේසි) | මාතර අදියර (IV) ජල සම්පාදන ව්‍යාපෘතියේ අන්තර් ගෙවීම් සහතික පත් අංක 01 සහ 02 සඳහා මුළු කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 2.5 කට වඩා අඩු බිල්පත් මත ගෙවීම් සිදු කර තිබුණි. | ගෙවීම්, මුළු කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 2.5 කට වඩා අඩු වුවද, එන්ඩීබී බැංකුවේ පොලී හිමිකම් වැළැක්වීම සඳහා අන්තර් සහතිකපත් අංක 1 හා 2 වෙනුවෙන් ගෙවීම් සිදු කරන ලදී. | එෆ්අයිඩීඅයිසී මාර්ගෝපදේශයේ සහ කොන්ත්‍රාත් කොන්දේසි සමඟ අනුගත වන බව සහතික විය යුතු වීම. |

**1.8 මුදල් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | 1999 සිට 2006 දක්වා කාලය තුළ ත්‍රිකුණාමලය, කැලණිය සහ අම්පාර ප්‍රාදේශිකවල සිදු කළ ලද රු.මිලියන 248.44 ක මුදල් වංචාව 2019 දෙසැම්බර් 31 දින වන විටත් වගකිවයුත්තන්ගෙන් අය කර ගෙන නොතිබුණි. | ඉහත පුද්ගලයින්ගෙන් මූල්‍ය හානිය පියවා ගැනීම සඳහා මණ්ඩලය විසින් ගල්කිස්ස දිස්ත්‍රික් අධිකරණයේ සිවිල් නඩුවක් ගොනු කර ඇත. | අනාගතයේ දී යටකී තත්වයන් වලක්වා ගැනීම සඳහා අභ්‍යන්තර පාලන පටිපාටි පවතින බවට සහතික විය යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| ii. | බණ්ඩාරවෙල ප්‍රාදේශිකයේ 2001 වර්ෂයේදී සිදුවී ඇති රු.272,735 ක මුදල් වංචාව 2019 දෙසැම්බර් 31 දින වන විටත් වගකිව යුතු පුද්ගලයන්ගෙන් අයකර ගෙන නොතිබුණි. | නඩුවක් ගොනු කළද තාක්ෂණික හේතුවක් මත එය නැවත ගොනු කිරීමට සිදුව ඇත. | අනාගතයේ දී යටකී තත්වයන් වලක්වා ගැනීම සඳහා අභ්‍යන්තර පාලන පටිපාටි පවතින වන බවට සහතික විය යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලයේ වටිනාකම රු.1,111,451,220 ක බදු පෙර ශුද්ධ අලාභයක් වූ අතර ඉකුත් වර්ෂයේ අනුරූප අලාභය රු.517,037,963 (නැවත සඳහන් කර ඇති) ක් විය. එබැවින් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.594,413,257 ක් වන දැවැන්ත පිරිහීමක් නිරීක්ෂණය විය. පරිපාලන වියදම්වල සැලකිය යුතු ඉහළ යාම හා පූර්ව වර්ෂය සමඟ සන්සන්දනය කිරීමේදී ගෙවිය යුතු ණයෙහි වූ සියයට 50 ක වර්ධනය මත වූ මූල්‍ය පිරිවැය ඉහළ යාම මෙම මූල්‍ය ප්‍රතිඵලයෙහි පිරිහීමට හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන් වල ප්‍රවණතා විශ්ලේෂණය

| විස්තරය | විචලන වටිනාකම වැඩිවීම/ (අඩුවීම) (රු. මි) | විචලනය % | විචලනයට හේතු |
|---|---|---|---|
| විකුණුම් පිරිවැය | 793 | 5 | පොම්ප කිරීමේ පිරිවැය, රසායනක පිරිවැය, අළුත්වැඩියා හා නඩත්තුව, වරිපණම් හා කුලී යනාදිය ඉහළ යාම. |
| මූල්‍ය ආදායම | (120) | (8) | ආයෝජන ආදායම පහළ යාම |
| මූල්‍ය පිරිවැය | 203 | 77 | පසුගිය වසර හා සන්සන්දනය කිරීමේදී සමාලෝචිත වර්ෂයේ ණය ගැනීම් ඉහළ යාම. |

### 2.3 අනුපාත විශ්ලේෂණය

ලබා දී ඇති තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා මණ්ඩලයේ වැදගත් අනුපාත කිහිපයක් පහත පරිදි වේ.

| වර්ෂය | 2019 | 2018 |
|---|---|---|
| දළ ලාභ ආන්තිකය | 36.29 | 36.22 |
| ශුද්ධ ලාභ ආන්තිකය | (4.26) | (2.30) |
| ජංගම අනුපාතය (වාර ගණන) | 1.48 | 2.81 |
| ක්ෂණික අනුපාතය (වාර ගණන) | 1.36 | 2.48 |
| මුළු වත්කම් පිරිවැටුම (වාර ගණන) | 0.04 | 0.05 |

ඉහත තොරතුරුවලට අනුව, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ ප්‍රධාන මූල්‍ය අනුපාතයන්හි අහිතකර තත්ත්වයක් පෙන්නුම් කර තිබුණි. ඉකුත් වර්ෂයේ සියයට 2.3 ක් වූ ශුද්ධ අලාභ ආන්තිකය සමාලෝචිත වර්ෂයේදී සියයට 4.26 ක ශුද්ධ අලාභ ආන්තිකයක් දක්වා තවදුරටත් පිරිහුණි. පසුගිය වර්ෂය හා සන්සන්දනය කිරීමේදී ජංගම වගකීම් යටතේ දක්වා ඇති වෙළඳ

හා වෙනත් ගෙවිය යුතු දෑ සියයට 130 කින් හා ණය වාරික හා පොලීහි වර්තමාන කොටස සියයට 120 කින් අසාමාන්‍ය ලෙස ඉහළ යාම හේතුවෙන් ජංගම අනුපාතය හා ද්‍රවශීලතා අනුපාතය පිළිවෙලින් වාර 1.33 කින් හා 1.12 කින් දැඩි ලෙස පහත වැටී තිබුණි. තවද ප්‍රධාන වශයෙන් සමාලෝචිත වර්ෂයේ විදේශ ණය ප්‍රමාණය ඉහළ යාම හේතුවෙන් ඉකුත් වර්ෂය හා සංසන්දනය කිරීමේදී මණ්ඩලයේ මුළු හිඟ ණය ශේෂය සියයට 50 කින් හෙවත් රු. බිලියන 100.28 සිට රු. බිලියන 151.35 දක්වා වැඩි වී තිබුණි. එබැවින් පසුගිය වර්ෂය සමඟ සන්සන්දනය කිරීමේදී ණය ස්කන්ධ අනුපාතය (තෝලන) සියයට 32 සිට සියයට 48 දක්වා සියයට 19 කින් වැඩි වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | දේශීය බැංකු යටතේ මූල්‍යනය වන ව්‍යාපෘති දෙකකට (02) අදාළව ණය වාරික ගෙවීම මණ්ඩලය විසින් ප්‍රමාද වීම හේතුවෙන් රු.1,561,573 කට සමාන වටිනාකමක් ප්‍රමාද පොලී ලෙස දරා තිබුණි. | ණය සේවාකරණ නිරවුල් කිරීම සඳහා මහා භාණ්ඩාගාරය විසින් අරමුදල් ලබා දීම ප්‍රමාද වීම හේතුවෙන් එච්එන්බී සහ කොමර්ෂල් බැංකුව රු.1,561,573 ක දඩ පොලියක් අය කරන ලදී. | නියමිත දිනයන්හිදී ණය සේවකරණ ගෙවීම් පියවන බවට සහතික විය යුතු වීම. |
| ii. | කළු ගඟට මුහුදු ජලය මිශ්‍ර වීම නිසා ඇති වූ පානීය ජල ගැටලුවට විසඳුමක් ලෙස රු.11,284,500 ක කොන්ත්‍රාත් වටිනාකමක ලවණ බාධකයක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවක් 2016 පෙබරවාරි 03 වන දින ප්‍රදානය කර තිබුණි. කෙසේ වෙතත් ඉදිකිරීමේ අපේක්ෂාව ලගා නොවීම හා අපේක්ෂිත පරිදි ජලයේ ලවණ සාන්ද්‍රණය අඩු වී නොතිබූ බැවින් ඒ සඳහා වැය කළ මුළු පිරිවැය අනාර්ථික වී තිබුණි. | ගැටළුව විසඳීම සඳහා කොන්ත්‍රාත් ප්‍රදානයේදී මණ්ඩලය විසින් අව්‍යාජ වෙහෙසක් ගෙන තිබුණි. ගංවතුර හේතුවෙන් වූ අවාසනාවන්ත සිදු වීම පැහැදිලිවම කොන්ත්‍රාත්කරුගේ හා මණ්ඩලයේ පාලනයෙන් බැහැර වේ. | (i.) අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කොන්ත්‍රාත්තු සැලසුම් කර ඇති බවට සහතික විය යුතු වීම.<br><br>(ii.) කොන්ත්‍රාත්තුවක් ආරම්භයේ සිට අවසානය දක්වාම විධිමත් අධීක්ෂණ යාන්ත්‍රණයක් පවතින බව සහතික විය යුතු වීම. |
| iii. | කටාන ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ ව්‍යාපෘතියේ අසම්භාව්‍ය ප්‍රතිපාදන උපයෝගී කරගනිමින් භූගත ජලාශයක් හා ධාරිතාවය ඝන මීටර් 1000 ක පොම්පාගාරයක් ඉදිකිරීමට රු.67,368,370 ක කොන්ත්‍රාත් වටිනාකමකට උප කොන්ත්‍රාත්තුවතක් ප්‍රදානය කර තිබුණි. කෙසේ වෙතත්, උපකොන්ත්‍රාත්තුවේ ප්‍රසම්පාදන ක්‍රියාකාරකම්වලට අදාළව සක්‍රීය ලෙස දායකවීමකින් තොරව මණ්ඩලයට ඉදිරිපත් කළ අන්තර් ගෙවීම් සහතික හරහා උපකොන්ත්‍රාත්කරුට අරමුදල් ප්‍රේෂණය කිරීම වෙනුවෙන් ප්‍රධාන කොන්ත්‍රාත්කරු විසින් රු.8,084,204 ක් ලාභාන්තිකයක් ලෙස අයකරගෙන තිබුණි. | අරමුදල් නොමැති වීම හේතුවෙන් ප්‍රදානිත කොන්ත්‍රාත්තුව හරහා කාර්යයන් සිදු කරන ලදී. එමනිසා පොදු කාර්ය වශයෙන් සියයට 12 ක ආන්තිකයක් කොන්ත්‍රාත්කරු අයකරන ලදී. | කොන්ත්‍රාත්කරුවන්ට අනවශ්‍ය ගෙවීම් වැළැක්වීම සඳහා කොන්ත්‍රාත් ලේඛන යළි ඇගයීමට ක්‍රියා කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| iv. | සේවක අංක 2022982 දරන ජ්‍යෝෂ්ඨ අභ්‍යන්තර විගණකවරියක විනය පරීක්ෂණ තීරණයන්ට යටත්ව 2017 මාර්තු 01 දින යළි සේවයේ පිහිටුවා තිබූ අතර රාජකාරී පැවරීමකින් තොරව 2017 මාර්තු 30 වන දින මණ්ඩලයේ තාක්ෂණික විගණන අංශය වෙත අනුයුක්ත කර තිබුණි. කෙසේ වෙතත්, 2017 මාර්තු 31 සිට 2020 අගෝස්තු 31 දක්වා ප්‍රසාද දීමනා ඇතුළු පුද්ගල පඩිනඩි වශයෙන් රු.6,637,668 එම සේවකයාට ගෙවා තිබුණි. | සටහන් කරගන්නා ලදී. | දැනට සිදු කරගෙන යනු ලබන සේවක විනය පරීක්ෂණ කඩිනම් කිරීමට පියවර ගත යුතු වීම සහ මානව සම්පත පූර්ණ වශයෙන් උපයෝජනය වන බවට සහතික විය යුතු වීම. |

**3.2 හඳුනාගත් පාඩු**

-----------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | අමුද්‍රව්‍ය බහාලුම් වරායෙන් නිදහස් කිරීමේ ප්‍රමාදය හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද පොල්ගහවෙල, පොතුහැර, අලව්ව ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියට, දැදුරු ඔය ජල සම්පාදන ව්‍යාපෘතියට, ආනමඩුව ජල සම්පාදන ව්‍යාපෘතියට සහ කැලණි දකුණු ඉවුරු ජල සම්පාදන ව්‍යාපෘතියට (අදියර II) අදාළව එකතු වටිනාකම රු. මිලියන 376.52 ක මුදලක් දඩ මුදල් ලෙස ගෙවා තිබුණි. | රජය විසින් රේගු ගාස්තු ගෙවීම අත්හිටවූ බැවින් හදිසි බැදීම් සපුරාලීමට ප්‍රමාණවත් අරමුදල් මණ්ඩලය සතුව නොපැවතිණි. | ආනයනික භාණ්ඩ ප්‍රමාදයකින් තොරව නිදහස් කරවා ගැනීමට හෝ අරමුදල් නොමැති නම් කොන්ත්‍රාත්කරු සමඟ සාකච්ඡා කොට නැව්ගත කිරීම් ප්‍රමාද කරවා ගැනීමට අවශ්‍ය පියවර ගත යුතු වීම. |
| ii. | නිවාස සංවර්ධන අධිකාරිය සඳහා ජල සම්බන්ධතා 28 ක් ලබා දී තිබූ බව නිරීක්ෂණය වූ අතර සමාලෝචිත වර්ෂයේ වාර්ෂික පරිභෝජනය රු. මිලියන 44.52 ක බිල්පත් අදායමකට සමාන කියුබික් මීටර 1,246,157 ක් විය. කෙසේ වෙතත්, එය 2019 දෙසැම්බර් 31 දින වන විටත් බිල් කර නොතිබුණි. | එය මේ වන විට විමර්ශන අදියරේ පවතින අතර එය නිවැරදි කරනු ඇත. | සියලුම ජල පරිභෝජනයන් බිල්ගත වන බවට සහතික විය යුතු වීම. |
| iii. | වෙළඳ පොළ වටිනාකම සමඟ සන්සන්දනය කිරීමේදී දැදුරු ඔය ජල සම්පාදන ව්‍යාපෘතියේ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා රු. මිලියන 21 ක අමතර ගෙවීමක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. | මෙය කොන්ත්‍රාත්තුවේ එක් අයිතමයකට පමණක් යොමු වේ. මෙය නිර්මාණ හා ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවක් වන හෙයින් එය වෙන්කළ නොහැකි වේ. | අසාමාන්‍ය ප්‍රතිපාදන සහිත ප්‍රමාණ පත්‍ර අයිතම සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරු සමඟ සාකච්ඡා කිරීමට පියවර ගත යුතු වීම. |

### 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | කළුගග (අදියර III) ව්‍යාපෘතිය, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ව්‍යාපෘතිය සහ කාත්තන්කුඩි අපජල අපහරණ ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 450 ක විදේශ ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂයේදී වෙන්කර තිබුණි. කෙසේ වෙතත්, කිසිදු ප්‍රතිපාදනයක් උපයෝජනය කර නොතිබුණි. | කළුගඟ (අදියර II) ව්‍යාපෘතිය සඳහා වූ උපදේශන සේවා ගිවිසුම මෑතකදී අත්සන් කරන ලදී. කාත්තන්කුඩි සහ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ව්‍යාපෘති මෙතෙක් ආරම්භ කර නොමැත. | සැලසුම් කළ පරිදි ව්‍යාපෘති ආරම්භ කරන බවට හා ව්‍යාපෘති සඳහා වෙන්කළ ප්‍රතිපාදන පූර්ණ වශයෙන් උපයෝජනය වන බවට සහතික විය යුතු වීම. |
| ii. | පාරිභෝගික පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී විශේෂයෙන්ම මාතර හම්බන්තොට, බණ්ඩාරවෙල, ගම්පහ හා මධ්‍යම ප්‍රාදේශිකයන්හි ආදයම් නොලබන ජලයට සෘජුව සම්බන්ධ පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී මන්දගාමී ප්‍රගතියක් පවතින බව නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | ප්‍රමාණවත් ජලය නොමැති වීම හේතුවෙන් මෙම ප්‍රාදේශිකයන්හි ඉල්ලුම සපුරාලිය නොහැකි විය. තවද මාර්ග සංවර්ධන අධිකාරිය හා ප්‍රාදේශීය මාර්ග සංවර්ධන අධිකාරියෙන් අනුමැතියන් ලබා ගැනීමේ ප්‍රමාදය හේතුවෙන් කාන්දුවීම් කඩිනමින් පිළිසකර කළ නොහැකි විය. | පාරිභෝගික පැමිණිලි සම්බන්ධයෙන් ප්‍රමාදයකින් තොරව කටයුතු කරන බවට සහතික විය යුතු වීම. |
| iii. | 2014 වර්ෂයේදී ප්‍රදානය කළද, තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතියේ තුළුමුව ඉදිකිරීමේ ස්ථානය සම්බන්ධයෙන් නිගමනයකට එළඹීමට 2020 ජූනි වන විටත් කළමනාකාරීත්වය අපොහොසත්ව තිබුණි. | තඹුත්තේගම ව්‍යාපෘතියේ ජලය බෙදාගැනීම සම්බන්ධයෙන් මේ වන විට ගොවීන් සමඟ සාකච්ඡා සිදුවෙමින් පවතී. | ජල සම්පාදන ව්‍යාපෘති ආරම්භයට පෙර ජල මූලාශ්‍ර සම්බන්ධ ගැටළු අවසන් කර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතු වීම. |
| iv. | 2008 සිට 2017 දක්වා කාලය තුළ කළුතර ප්‍රාදේශිකයේ මනුසටහන්කරුවෙකු විසින් සිදු කරන ලද රු.1,145,235 ක වංචාවක් 2020 ජූලි 31 වන දින වන විටත් වගකිවයුතු පාර්ශවයන්ගෙන් අය කරගෙන නොතිබුණි. | අලාභ ගණනය කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන තිබූ අතර එවැනි අවස්ථාවන් සඳහා අලාභ ගණනය කිරීම සඳහා පද්ධතියක් හඳුන්වා දෙන ලෙස වාණිජ අංශයට දන්වා ඇත. මෙම ගැටළුව උපදෙස් සඳහා නීතිපති දෙපාර්තමේන්තුවට යොමු කර ඇත. | ව්‍යාජ මනුකියවීම් හේතුවෙන් සිදුවන අලාභයන් සේවකයින්ගෙන් අය කිරීම සඳහා නිසි ක්‍රමවේදයක් හඳුන්වා දීමට කඩිනම් පියවර ගැනීම හා ඒ වෙනුවෙන් පවතින පරිපාලන චක්‍රලේඛ යාවත්කාලීන කිරීම අවශ්‍ය වේ. |

| | | | |
|---|---|---|---|
| v. | 2017 සිට 2019 වර්ෂය දක්වා මනුසටහන්කරුවන් විසින් සිදු කරන ලද අක්‍රමිකතා සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවට අනුව මොනරාගල ප්‍රාදේශිකයේ අක්‍රමිකතා දෙකක්ද, කළුතර හා මධ්‍යම ප්‍රාදේශිකයේ අක්‍රමිකතා දෙකක්ද සිදු කර තිබුණි. තවද, මොනරාගල ප්‍රාදේශිකයේ වැල්ලවායේදී සිදු කළ අක්‍රමිකතා අතරින් පාරිභෝගියකයන් විසින් බිල්පත් ගෙවීම ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් ඇති වූ අලාභය 2020 ජනවාරි 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි. | මොනරාගල ප්‍රාදේශිකයේ මනුසටහන්කරු කොන්ත්‍රාත් පදනම යටතේ සිටි අතර ඔහුගේ සේවය අවසන් කර ඇත. නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් මත අලාභ අයකර ගැනීමේ ක්‍රියාමාර්ග සිදුකරමින් පවතී. | මනුසටහන්කරු පුරප්පාඩු ස්ථිර සේවකයින්ගෙන් පිරවීමට ක්‍රියාමාර්ග ගත යුතු අතර ව්‍යාජ මනු සටහන් හේතුවෙන් සිදු වන අලාභ අයකර ගැනීමට නිසි යාන්ත්‍රණයක් හඳුන්වා දිය යුතු වීම. |
| vi | අදායම් නොලබන ජලය අවම කර ගැනීම සඳහා ඵලදායී ප්‍රයත්නයක් ගෙන නොමැති බව පෙන්වමින් ඉහළ යන පිරිපහදු කළ ජල නිෂ්පාදනය සමඟ අදායම් නොලබන ජල පරිමාවද ක්‍රමයෙන් ඉහළ යමින් පවතී. ඒ අනුව, මණ්ඩලය සියයට 23.3 දක්වා අඩු කිරීමට සැලසුම් කර තිබුණද, 2018 වර්ෂයේ වූ සමස්ත ආදායම් නොලබන ජල ප්‍රතිශතය කිසිදු වෙනසකින් තොරව 2019 වර්ෂයේදීත් පැවතුණි. | ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථාන මට්ටමින් ආදායම් නොලබන ජලය අවම කරගැනීම සඳහා කෙටිකාලීන පිළියම් හඳුනාගැනීමට සහ ක්‍රියාත්මක කිරීමට මණ්ඩලය අඛණ්ඩව කටයුතු කරමින් සිටියි. මෙහෙයුම් හා නඩත්තු අයවැය සීමිත වීම හේතුවෙන් සැලසුම් කළ පරිදි ප්‍රාදේශිකයන්හි අදායම් නොලබන ජලය අවම කර ගැනීම සිදු නොවූ අතර එය ඉලක්ක ළඟා කර ගැනීම සඳහා අහිතකර ලෙස බලපායි. | ආදායම් නොලබන ජලය අවම කර ගැනීම සඳහා වැඩි අවධානය යොමු කිරීමටත් ඒ සඳහා ප්‍රමාණවත් අයවැය වෙන් කිරීමටත් ක්‍රියාමාර්ග ගත යුතු වීම. |
| vii. | කොළඹ නගරය, ගාල්ල, කෑගල්ල, රත්නපුර, හම්බන්තොට, බණ්ඩාරවෙල, මහනුවර සහ ත්‍රිකුණාමලය ප්‍රාදේශිකයන්හි සමාලෝචිත වර්ෂයේ ආදායම් නොලබන ජලය ප්‍රතිශතය සියයට 25 කට වඩා වැඩි බව නිරීක්ෂණය විය. නීත්‍යානුකූල නොවන ජල සම්බන්ධතා,වසර 70 කට වඩා ඉහත දී සවි කරන ලද පවත්නා නල පද්ධතිය ප්‍රතිස්ථාපනය කිරීමට අපොහොසත් වීම, මනු කියවන්නන්ගේ කිහිපදෙනෙකුගේ විෂමාචාරයන්, ආදායම් නොලබන ජලය හා කාන්දු වීම් සම්බන්ධයෙන් වන පාරිභෝගික පැමිණිලි සඳහා අඩු අවධානයක් ලබා දීම මෙම ප්‍රාදේශිකයන්හි ඉහළ මට්ටමක වූ ආදායම් නොලබන ජල ප්‍රතිශතයට හේතු වන ප්‍රධාන සාධකයන් ලෙස හඳුනාගෙන තිබුණි. කෙසේ වෙතත්, අක්‍රීය තොග ජල මනු සහ ඒවා අවිධිමත් ලෙස ක්‍රමාංකනය කිරීම, නිසි වාර්තා නොමැති වීම, ශුන්‍ය බිල්පත් හා ඇස්තමේන්තු බිල්පත් නිකුත් කිරීම යනාදිය හේතුවෙන් | නිරීක්ෂණය සටහන් කර ගන්නා ලදී. | ප්‍රාදේශීය වශයෙන් අදායම් නොලබන ජලය අවම කර ගැනීමට වැඩි අවධානය යොමු කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු අතර අදායම් නොලබන ජලය අවම කර ගැනීමේ ව්‍යාපෘති නියමිත දිනට නිම කිරීම කඩිනම් කර ගැනීමට ඉක්මන් ක්‍රියාමාර්ග ගත යුතු වීම. |

බොහෝ ප්‍රාදේශිකයන්හි ආදායම් නොලබන ජල ප්‍රතිශතයෙහි නිරවද්‍යතාවය පිලිබඳව අවිනිශ්චිත වේ. ඒ අනුව ප්‍රාදේශිකයන් 24 ක වූ තොග මනු 1332 ක් අතරින් මනු 159 ක් හෙවත් සියයට 12 ක ප්‍රතිශතයක් 2019 ඔක්තෝම්බර් 31 දිනට අක්‍රිය බව නිරීක්ෂණය විය. එබැවින් අක්‍රිය තොග මනු ප්‍රතිස්ථාපනයට හා ඒවා කාලීනව ක්‍රමාංකනය කිරීමට විශේෂ අවධානයක් ලබා දිය යුතු වේ.

| | | |
|---|---|---|
| viii. | සමාලෝචිත වර්ෂය අවසානයටද සියයට 41 ක්ව පැවති කොළඹ නගරයේ ආදායම් නොලබන ජලය අවම කර ගැනීමට සැලකිය යුතු පරිශ්‍රමයක් ගෙන නොතිබුණි. වර්තමානයේදී මේ සම්බන්ධයෙන් ප්‍රධාන විදේශ මූල්‍යන ව්‍යාපෘති දෙකක් ක්‍රියාත්මක වෙමින් පැවතියද, ප්‍රමාණවත් ජල පද්ධති යළි ඉදිකිරීම් ලගා කර ගෙන නොතිබුණි. | ව්‍යාපෘති ප්‍රමාදයට ප්‍රධාන හේතූන් වූයේ,<br>• නිවැරදි සිතියම් සහ අනෙකුත් උපයෝගිතා සම්බන්ධයෙන් ජීඅයිඑස් තොරතුරු නොතිබීම හේතුවෙන් අනපේක්ෂිත භූගත උපයෝගිතා පැන නැගීම<br>• අනෙකුත් නියෝජිත ආයතනයන්ගෙන් අවසර ලබා ගැනීමේ ප්‍රමාදය<br>• ප්‍රධාන වශයෙන් මාර්ග සංවර්ධන අධිකාරියේ ඉඩම් අත් කර ගැනීම් , ඛනිජ තෙල්, වරාය අධිකාරිය හා සතුටු උයන ප්‍රමාදයන් හේතුවෙන් උතුරු හා දකුණු ජල ප්‍රභවයන් අතර බෙදාහැරීම් ප්‍රමාද විය.<br>• සීමා කරන ලද රාජකාරී පැය මත පමණක් රාත්‍රී වැඩ සඳහා ඉඩදීම.<br>• වැඩ ආරම්භ කිරීමේ අනපේක්ෂිත ප්‍රමාදය<br>• පවත්නා නල විසන්ධි කිරීම් කාර්යයන්හි අපහසුතා |

## 3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | 2019 දෙසැම්බර් 31 දිනට ආනයනික මාර්ගස්ථ තොග වටිනාකම රු.876,232,735 ක් විය. ඒ අතරින් රු.162,922,454 ක් වූ තොග වසර දෙකකට වඩා වැඩි කාලයක් තිස්සේ විමර්ශනයකින් තොරව මාර්ගස්ථ තොග ලෙස පැවතුණි. තවද, ආනයනික මාර්ගස්ථ තොග මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ තොග ලෙස දැක්වීම වෙනුවට සංචලන හා වෙනත් අත්තිකාරම් යටතේ වැරදි ලෙස දක්වා තිබුණි. | භාණ්ඩ මිලදී ගැනීම සඳහා ගෙවන ලද අත්තිකාරම් මෙම ගිණුමේ වාර්තා කරනු ලැබේ. එබැවින් එය මූල්‍ය ප්‍රකාශනයන්හි සංචලන හා වෙනත් අත්තිකාරම හි දක්වා ඇත. නිශ්චිත ප්‍රාදේශිකයකට භාණ්ඩ ලද පසු එය තොග ලෙස සටහන් කරනු ලැබේ. | දීර්ඝ කාලීන මාර්ගස්ථ තොග ශේෂයන් විමර්ශනය කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වීම සහ මාර්ගස්ථ තොගයන් මූල්‍ය ප්‍රකාශ හඳුනාගැනීමේ නිරවද්‍යතාවය සහතික විය යුතු වීම. |
| ii. | තොග භෞතිකව සත්‍යාපනය කිරීමට පෙර සියලුම තොග ලැබීම් සහ නිකුත් කිරීම් තොග වාර්තා වල සටහන් කළ යුතු වේ. කෙසේ වෙතත්, තොග ලැබීම් හා නිකුත් කිරීම් සම්බන්ධයෙන් ශුද්ධ හර ශේෂය වූ රු.762,254,425 ක් සහ ශුද්ධ බැර ශේෂය වූ රු.894,694,445 ක් තොග සමීක්ෂණයකින් පසුව තොග ශේෂයට ගලපා තිබුණි. | භාණ්ඩ සමීක්ෂණය නොවැම්බර් මුලදී ආරම්භ කරන අතර දෙසැම්බර් දක්වා වන ගැලපුම් ඒ අනුව ගැලපිය යුතු වේ. | භෞතික තොග සත්‍යාපනයට පෙර සියලුම තොග ලැබීම් සහ තොග නිකුත් කිරීම්, තොග වාර්තාවල සටහන් කිරීමට පියවර ගත යුතු වීම. |
| iii. | උතුරුමැද භූගත ජල අංශයේ යළි අයකර ගත හැකි වැඩ සඳහා වන රු.6,005,215 ක අසාමාන්‍ය හර ශේෂයක් හා මාර්ගස්ථ මුදල්හි රු.665,580 ක අසාමාන්‍ය බැර ශේෂය 2020 ජූනි 30 දිනටත් නිරවුල් කර නොතිබුණි. | සහතික කිරීම අවසන් වූ විගස යළි අයකර ගැනීමේ ශේෂයන් නිරවුල් කිරීමට අදාළ ප්‍රවේශයන් සම්මත කරගනු ඇති අතර මාර්ගස්ථ මුදල් ශේෂය 2020 දී නිවැරදි කරනු ඇත. | මාර්ගස්ථ තොග ගිණුමේ වන මෙවැනි අසාමාන්‍ය ශේෂයන් විමර්ශනය කොට නිරවුල් කර ගත යුතු වීම. |
| iv. | කොටිකාවත්ත මුල්ලේරියාව ජල සම්පාදන යෝජනා ක්‍රමය සඳහා භූගත ජලාශයක් හා ජල ටැංකියක් ඉදිකිරීමට ගොතටුව රෝහල් පරිශ්‍රයේ පිහිටා ඇති ඉඩමක් 2001 අප්‍රේල් 04 වන දින අත්පත් කර ගෙන තිබූ අතර 2001 සිට 2018 දෙසැම්බර් 31 කාලපරිච්ඡේදය සඳහා එකතුව රු.10,103,750 ක් වන කල් බදු කුලියක් සහ 2001 සිට 2009 කාල පරිච්ඡේදය සඳහා රු.104,500 ක දඩ මුදලක් මණ්ඩලය විසින් කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් වෙත ගෙවා තිබුණි. කෙසේ වෙතත් ගෙවීම් නිවැරදිතාවය නිශ්චය කර ගැනීම සඳහා කිසිඳු කල්බදු ගිවිසුමක් විගණනය වෙත ඉදිරිපත් නොවීය. | අදාළ ලේඛන ඉදිරිපත් කරනු ඇත. | සියලුම කල්බදු වාරික වලංගු කල්බදු ගිවිසුමක් මත පදනම්වන බව සහතික විය යුතු වීම. |

## 3.5 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | එකතු වටිනාකම රු.8,692,053 ක් වන පාවිච්චි කළ නොහැකි තත්ත්වයේ පවතින ජල මනු අමතර කොටස් තුන්දහස් එකසිය අනූ දෙකක් (3192) සහ තොග ජල මනු අමතර කොටස් එකසිය හතලිස් හතරක් (144) වසර දෙකකට වඩා වැඩි කාලයක් අපේක්ෂිත අරමුණු සඳහා උපයෝජනය නොකර රත්මලාන වැඩ අංගනය තුළ සමාලෝචිත වර්ෂය අවසානයට පැවතුණි. | ජලමනු අමතර කොටස් අලුත්වැඩියා කර ඇති අතර දැනටමත් භාවිතයට ගෙන ඇත. | වාර්ෂික අවශ්‍යතාවය අනුව ජල මනු ඇනවුම් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වීම. |
| ii. | වටිනාකම රු.54,253,067 ක් වන විවිධ පරිමාණයන් දහයකට අයත් ජල මනු හයදහස් හාරසිය තිස් හතරක් (6,434) අපේක්ෂිත අරමුණු කරා යොදා ගැනීමකින් තොරව වසරකට වඩා වැඩි කාලයක් සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රධාන ගබඩාව තුළ පැවතුණි. තවද, ඇතැම් ජල මනුවන්හි වගකීම් කාලය දැනටමත් ඉකුත් වී ඇති බව නිරීක්ෂණය විය. | එයින් බොහෝමයක් අගල් ¾ මනුවලින් සමන්විත වූ අතර එයින් 19045 ක් තවමත් ඉතිරිව පවතින අතර ඉතිරිය නව ජල සම්බන්ධතා සඳහා යොදාගෙන ඇත. | ඉදිරියේදී ජල මනු සඳහා ඇණවුම් ඉදිරිපත් කිරීම, ඒවායේ තොග පාලන මට්ටම් සැලකිල්ලට ගැනීමෙන් පසුව සිදු කළ යුතු වීම. |
| iii. | 2019 දෙසැම්බර් 31 දිනට චලනය නොවන තොග සහ සෙමින් චලනය වන තොග වටිනාකම් පිළිවෙලින් රු.547,150,801 ක් හා රු.492,415,394 ක් වේ. එය මණ්ඩලයේ මුළු තොග වලින් පිළිවෙලින් සියයට 6 ක් හා සියයට 5 ක් නියෝජනය කර තිබුණි. | චලනය නොවන සහ සෙමින් චලනය වන අයිතමයන් සත්‍යාපන අවස්ථාවේදී සමීක්ෂණ කණ්ඩායම හඳුනාගනී. හදිසි අවශ්‍යතාවයන්ට මුහුණ දීම සඳහා ඇතැම් වර්ගයේ පයිප්ප හා උපාංග ආනයනය කොට වැඩබිම්හි රඳවා ගනු ලැබේ. | චලනය නොවන සහ සෙමින් චලනය වන තොග මඟහරවා ගැනීම සඳහා තොග පාලන මට්ටම් පිළිබඳ සැලකිල්ලට ගනිමින් අනාගතයේදී තොග ඇණවුම් කළ යුතු වීම. |
| iv. | කටුගස්තොට පිරිපහදු මධ්‍යස්ථානයේ 2007 වර්ෂයේදී සවිකරන ලද ධාරිතාවය කිලෝ වොට් ඇම්පියර් 2000 ක් වන ජෙනරේටරයක් රු. මිලියන 15 ක් වැය කරමින් 2016 මාර්තු 28 වන දින අලුත්වැඩියා කර තිබුණි. කෙසේ වෙතත්, 2019 අප්‍රේල් 01 දිනට වගකීම් පැය 1500 න් සහ වසර 05ක වගකීම් කාලයෙන් අලුත්වැඩියාවෙන් වසර දෙකක් ඉකුත් වීමෙන් පසු පැය 189 ක් සම්පූර්ණය කිරීමෙන් පසුව ක්‍රියා විරහිත වූ අතර, 2020 මාර්තු 30 දින වන විටත් එය නැවත අලුත්වැඩියා කර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මෙය කොන්ත්‍රාත්කරුට දන්වා ඇතත් අමතර කොටස් ප්‍රමාදය හේතුවෙන් අලුත්වැඩියාව අවසන් කිරීම ප්‍රමාද වේ. | වගකීම් කාලය තුළදී කැඩුණු යන්ත්‍ර සහ උපකරණ අලුත්වැඩියා කර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතු වීම සහ මණ්ඩලයේ වත්කම්වල පූර්ණ උපයෝජනය සහතික විය යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| v. | විසල් මහනුවර ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා රු.166,993,899 ක පිරිවැයකට විද්‍යාගාරයක් 2016 වර්ෂයේදී ඉදිකර තිබුණි. කෙසේ වෙතත්, මණ්ඩලය විසින් ප්‍රසම්පාදනය කරනු ලබන ජල උපාංග පරීක්ෂා කිරීම හැර අපේක්ෂිත අරමුණු සඳහා එය 2020 අගෝස්තු 31 දින වන තෙක් පූර්ණ වශයෙන් උපයෝජනය කොට නොතිබුණි. | මෙම විද්‍යාගාරය සඳහා අයිඑස්ඕ 17025 ප්‍රතීතන සහතිකය මණ්ඩලයට ලබා ගත නොහැකි විය. එබැවින් විද්‍යාගාරය පිහිටුවීමෙන් අපේක්ෂිත අරමුණු පූර්ණ වශයෙන් ලඟා කරගැනීමට නොහැකි වී ඇත. කෙසේ වෙතත්, එය මණ්ඩලය ප්‍රසම්පාදනය කරගනු ලබන ජල උපාංග පරීක්ෂා කිරීම සඳහා භාවිතා කරනු ලබයි. | විසල් මහනුවර ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ ඉදිකර ඇති රසායනාගාරයේ සම්පත් භාවිතා කිරීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතු වීම. |
| vi. | මාතලේ ජල පිරිපහදු මධ්‍යස්ථානය සඳහා 2016 අප්‍රේල් මාසයේදී පිරිවැය රු.3,895,000 ක (ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා සියයට 47 ක් වැඩි) ධාරිතාවය කියුබික් මීටර 1 ක් වන ඇලම් පොම්ප 2 ක් ප්‍රසම්පාදනය කොට තිබුණි. කෙසේ වෙතත්, 2020 මාර්තු 30 වන විටත් ඉහත එකදු පොම්පයක්වත් අපේක්ෂිත අරමුණු සඳහා උපයෝජනය කර නොතිබුණි. | එකී පොම්ප මීවතුර පිරිපහදු මධ්‍යස්ථානයට නිකුත් කර ඇත. | අනවශ්‍ය ප්‍රසම්පාදනයන් වළක්වා ගැනීමටත්, වගකිව යුතු නිලධාරීන්ගෙන් එම අලාභ අයකර ගැනීමටත් පියවර ගත යුතු වීම. |

### 3.6 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | කොන්ත්‍රාත්කරුවන්ගේ දුර්වල කාර්ය සාධනය, ඉඩම් නිරවුල් කිරීමේ ප්‍රමාදවීම, පාරිසරික හා නැවත පදිංචි කරවීමේ ගැටළු, කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ ප්‍රමාදය, කොන්ත්‍රාත්කරු විසින් සපයනු ලැබූ පී.ඊ. පයිප්පවල බාල ගුණත්වය, මාර්ග සංවර්ධන අධිකාරියේ අනුමැතිය ලබාගැනීමේ ප්‍රමාදය ආදිය හේතුවෙන් විදේශ මූල්‍යන ව්‍යාපෘති අටක් සම්බන්ධයෙන් සැලකිය යුතු ප්‍රමාදයක් නිරීක්ෂණය විය. විස්තර පහත පරිදිවේ. | <u>යාපනය කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය</u><br>මාර්ග සංවර්ධන අධිකාරිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව යනාදියෙන් අනුමැතීන් ලබා ගැනීමේ ප්‍රමාදය සහ කොන්ත්‍රාත්කරුවන්ගේ දුර්වල කාර්යසාධනය නිසා ව්‍යාපෘති නිමකිරීම ප්‍රමාද විය.<br><br><u>මහනුවර අපජල කළමනාකරණ ව්‍යාපෘතිය</u><br>ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රමාදය, නිර්මාණය කිරීම, අමුද්‍රව්‍ය සැපයීම සහ ඉදිකිරීමේදී කොන්ත්‍රාත්කරුවන්ගේ ප්‍රමාදය, නිර්මාණ සංශෝධනය කිරීම, විවිධ ආයතනයන්ගේ මැදිහත්වීම සහ අනපේක්ෂිත හේතූන්, අයහපත් කාලගුණික තත්ත්වය, | ව්‍යාපෘති ප්‍රමාදවීම් හා එමඟින් කොන්ත්‍රාත්කරුවන් ට දෙනු ලබන කාලය දීර්ඝ කිරීම වැළැක්වීමට පියවර ගත යුතු වීම හා එවැනි කාල දීර්ඝ කිරීමක් ලබා දෙන විටක කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව ප්‍රමාද ගාස්තු අය කරන බවට සහතික විය යුතු වීම. |

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තු ගත පිරිවැය (රු.මි.) | ආරම්භක දිනය | සම්පූර්ණ කළ දිනය | දීර්ඝ කිරීමේ කාලය | 2019 දෙසැ. 31 දිනට ප්‍රමාදය (දින ගණන) |
|---|---|---|---|---|---|
| වියළි කලාපීය ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය | 19,165 | 13/11/2009 | 31/12/2016 | 31/12/2016 – 31/12/2018 | 1095 |
| යාපනය කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය | 16,475 | 15/02/2011 | 14/02/2017 | 14/02/2017 - 31/12/2020 | 1050 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| මහනුවර අපජල කළමනාකරණ ව්‍යාපෘතිය | 17,278 | 03/02/ 2012 | 30/09/ 2017 | 30/09/2017 - 31/12/2022 | 848 | වැඩවර්ජන, රට තුළ සිවිල් නොසන්සුන්තාවය සහ ත්‍රස්ත ප්‍රහාර යන සියල්ලම ව්‍යාපෘති ප්‍රගතියට හේතු විය. |
| මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය | 1,731.70 | 18/12/ 2009 | 31/12/ 2014 | 31/12/2014 - 31/12/2017 | 1825 | |
| මහ කොළඹ ජල හා අපජල කළමනාකරණ ප්‍රවර්ධන ආයෝජන වැඩසටහන (I) | 14,784 | 25/09/ 2013 | 31/12/ 2016 | 31/12/2016 - 31/12/2020 | 1095 | **<u>මහ කොළඹ ජල හා අපජල කළමනාකරණ ප්‍රවර්ධන ආයෝජන වැඩසටහන (01) සහ වැඩසටහන (02)</u>**<br>ප්‍රමාදවීම් සඳහා ප්‍රධාන හේතූන් වූයේ,<br>• අනෙකුත් උපයෝගිතා සම්බන්ධයෙන් නිවැරදි සිතියම් සහ ජීඅයිඑස් තොරතුරු නොතිබීම හේතුවෙන් අනපේක්ෂිත භූගත උපයෝගිතා පැන නැගීම.<br>• කොළඹ මහ නගර සභාව, විදුලි බල මණ්ඩලය, මාර්ග සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා පොලිසිය, ශ්‍රී ලංකා ඉඩම් ප්‍රතිසංස්කරණ හා සංවර්ධනය කිරීමේ මණ්ඩලය, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, ශ්‍රී ලංකා ඛණිජ තෙල් සංස්ථාව යනාදී අනෙකුත් නියෝජිත ආයතනවලින් අනුමැතීන් ලබා ගැනීමේ ප්‍රමාදය.<br>• අනෙකුත් උපයෝගීතාවලට අනුමැතීන් යොමු කිරීම විශේෂයෙන්ම විදුලිබල මණ්ඩලය.<br>• මාර්ග සංවර්ධන අධිකාරියේ ඉඩම් අත් කර ගැනීම් , ඛනිජ තෙල්, වරාය අධිකාරිය හා සතුටු උයන ප්‍රමාදයන් හේතුවෙන් උතුරු හා දකුණු ජල ප්‍රභවයන් අතර බෙදාහැරීම් ප්‍රමාද විය.<br>• සීමා කරන ලද රාජකාරී පැය සමග පමණක් රාත්‍රී වැඩ සඳහා ඉඩ ලබා දීම. |
| මහ කොළඹ ජල හා අපජල කළමනාකරණ ප්‍රවර්ධන ආයෝජන වැඩසටහන (II) | 13,917 | 03/09/ 2014 | 30/06/ 2019 | 30/06/2019 - 31/12/2020 | 184 | |
| නිමවුම් පාදක අධාර මත වන ගෝලීය හවුල්කරු ව්‍යාපෘතිය | 13,000 | 31/12/ 2011 | 31/12/ 2015 | 31/12/2015 - 31/03/2019 | 1460 | |

- වැඩ ආරම්භ කිරීමේ අනපේක්ෂිත ප්‍රමාදය

- පවත්නා නල විසන්ධි කිරීම් කාර්යයන්හි අපහසුතා

<u>**නිමවුම් පාදක අධාර මත වන ගෝලීය හවුල්කරු ව්‍යාපෘතිය**</u>
ටෙන්ඩර් ලියවිලි නිර්දේශ කිරීමේ හා ව්‍යාපෘති විෂය පථය තීරණය කිරීමේ ප්‍රමාදය හේතුවෙන් ටෙන්ඩර් කැඳවීම ප්‍රමාද වීම. ඊට අමතරව අමුද්‍රව්‍ය ප්‍රවාහනයේ, ඉදිකිරීම් අධීක්ෂණය සහ යන්ත්‍ර ප්‍රවාහනය කිරීමේ දුෂ්කරතා ප්‍රතිලාභීන් නිර්මාණය කිරීමේ හා තෝරා ගැනීමේ දුෂ්කරතා.

**3.7 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | <u>**3.7.1 මහකොළඹ ජල හා අපජල කළමනාකරණ ආයෝජන වැඩ සටහන - ව්‍යාපෘතිය 01 සහ ව්‍යාපෘතිය 02**</u><br>පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ. | | |
| (අ) | මෙම ව්‍යාපෘතිය 2013 සැප්තැම්බර් 25 වන දින ආරම්භ කොට 2016 දෙසැම්බර් 31 දින නිමකිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය හේතුවෙන් 2020 දෙසැම්බර් 31 දක්වා අවස්ථා දෙකකදී කාල දිගුවන් ලබා දී තිබුණි. වැඩසටහනේ ප්‍රගති වාර්තා අනුව සමාලෝචිත වර්ෂය අවසානයට සමස්ථ භෞතික හා මූල්‍ය කාර්යසාධනය පිළිවෙලින් සියයට 75.22 ක් හා සියයට 84.12 ක්ව පැවතුණි. | **(අ) <u>ව්‍යාපෘතිය 01</u>**<br>• අනෙකුත් උපයෝගිතා සම්බන්ධයෙන් නිවැරදි සිතියම් සහ ජීඅයිඑස් තොරතුරු නොතිබීම හේතුවෙන් අනපේක්ෂිත භූගත උපයෝගිතා පැන නැගීම.<br>• කොළඹ මහ නගර සභාව, විදුලි බල මණ්ඩලය, මාර්ග සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා පොලිසිය, ශ්‍රී ලංකා ඉඩම් ප්‍රතිසංස්කරණ හා සංවර්ධන කිරීමේ මණ්ඩලය, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, ශ්‍රී ලංකා ඛණිජ තෙල් සංස්ථාව යනාදී අනෙකුත් නියෝජිත ආයතනවලින් අනුමැතීන් ලබා ගැනීමේ ප්‍රමාදය. | (i) කොන්ත්‍රාත් කාලය තුළ ව්‍යාපෘතිය නිම කිරීමට හැකිවන පරිදි ව්‍යාපෘතියේ කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතු වීම.<br>(ii) කොන්ත්‍රාත් ගිවිසුමේ විධිවිධාන සමඟ දැඩි ලෙස අනුගත වන බව සහතික විය යුතු වීම. |

- අනෙකුත් උපයෝගීතාවලට අනුමැතීන් යොමු කිරීම විශේෂයෙන්ම විදුලිබල මණ්ඩලය.

- මාර්ග සංවර්ධන අධිකාරියේ ඉඩම් අත් කර ගැනීම්, ඛනිජ තෙල්, වරාය අධිකාරිය හා සතුටු උයන ප්‍රමාදයන් හේතුවෙන් උතුරු හා දකුණු ජල ප්‍රභවයන් අතර බෙදාහැරීම් ප්‍රමාද විය.

- සීමා කරන ලද රාජකාරී පැය සමග පමණක් රාත්‍රී වැඩ සඳහා ඉඩ ලබා දීම.

- වැඩ ආරම්භ කිරීමේ අනපේක්ෂිත ප්‍රමාදය

- පවත්නා නල විසන්ධි කිරීම් කාර්යයන්හි අපහසුතා

(ආ) වැඩසටහන් 02 හි ව්‍යාපෘති කාලය 2019 ජූනි 30 දිනට ඉකුත් වී තිබුණි. අනතුරුව 2022 ඔක්තෝම්බර් 15 දක්වා ව්‍යාපෘති කාලය දීර්ඝ කරවාගෙන තිබුණි. ව්‍යාපෘතිය විසින් ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම්හි මන්දගාමී ප්‍රගතිය හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට සමස්ථ භෞතික හා මූල්‍ය කාර්යසාධනය පිළිවෙලින් සියයට 46.65 ක්ව සහ සියයට 52.11 ක්ව පැවතුණි.

**(ආ) <u>ව්‍යාපෘතිය 02</u>**

කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය අවම කර ගැනීමට කොන්ත්‍රාත්කරු සමග සාකච්ඡා පැවති අතර ඒ අනුව උපදෙස් දෙන ලදී.

(ඇ) නල එලීම සහ පීඩන පරීක්ෂාව, ලබාදී තිබූ පාරිභෝගික සම්බන්ධතා යනාදිය සම්බන්ධයෙන් උතුරු, නැගෙනහිර, බස්නාහිර හා දකුණ කොටස්වල ආදායම් නොලබන ජලය සඳහා පද්ධති පුනරුත්ථාපන කොන්ත්‍රාත්තුව මන්දගාමී භෞතික ප්‍රගතියක් පෙන්වයි.

සංශෝධිත ප්‍රගතිය ලබා දී තිබුණි.

ii. **<u>3.7.2 අඹතලේ බලශක්ති ඉතිරි කිරීමේ ව්‍යාපෘතිය</u>**

පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතිය එහි කටයුතු 2014 සැප්තැම්බර් 29 වන දින ආරම්භ කර තිබූ අතර 2019 ජුනි 30 දිනට අවසන් කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත් සැලසුම් කළ ව්‍යාපෘති කාලය තුළ ඉලක්ක කරා ලගා වීමට ව්‍යාපෘතියට නොහැකි වී තිබූ අතර 2022 මැයි 31 දක්වා ව්‍යාපෘති කාලය දීර්ඝ කර තිබුණි. ව්‍යාපෘතියේ ප්‍රගති වාර්තා අනුව 2019 දෙසැම්බර් 31 දිනට සහ 2020 මැයි 31 දිනට සමස්ත භෞතික ප්‍රගතිය පිළිවෙලින් සියයට 23.08 ක් සහ සියයට 26.31 ක් විය. තවද, ව්‍යාපෘතියේ ප්‍රධාන සංරචක පහ අතරින්, 15,000m$^3$ ක ගොතටුව ජලාශය සහ කිලෝමීටර 5 ක් සඳහා 1200mm ඩීඅයි පයිප්ප (අයිසීබී03) සැපයුම් කොට එලීම සමඟ බූස්ටර පොම්පාගාර මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා වන කොන්ත්‍රාත්තුවන් 2020 ජූලි 31 දින වන විටත් ප්‍රදානය කොට නොතිබුණි. | ව්‍යාපෘති ක්‍රියාකාරකම් ප්‍රමාදයට හේතු<br><br>**<u>(අ) නිර්මාණ සමාලෝචනය සහ ඉදිකිරීම් අධීක්ෂණය සඳහා වූ උපදේශන කොන්ත්‍රාත්තුව</u>**<br>ඉදිකිරීම් කොන්ත්‍රාත්තු පැකේජයන් ප්‍රමාදය හේතුවෙන් අන්තර්ජාතික හා දේශීය විශේෂඥයන් මුල් සැලැස්මට අනුව සංචලනය නොවිය.<br><br>**<u>අඹතලේ සිට එළිහවුස් ජලාශය දක්වා මිලිමීටර 1200 විශ්කම්භයෙන් යුතු ඩීඅයි පයිප්ප සැපයුම් කිරීම සහ කිලෝමීටර 9 ක් ඇතිරීම</u>** අයවැය ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් එකතු කළ අගය මත බදු සමග හිඟ ගෙවීම් ප්‍රමාද විය.<br>• කොන්ත්‍රාත්කරු විසින් නල එලීම් වැඩ 2019 නොවැම්බර් 25 වන දින යළි ආරම්භ කරන ලදී.<br>• කෝවිඩ් 19 හේතුවෙන් 2020 මාර්තු 18 වන දින වැඩ අත්හිටවූ අතර 2020 මැයි 06 වන දින යළි ආරම්භ කරන ලදී.<br><br>**<u>මිලිමීටර 1200 ඩීඅයි පයිප්ප සැපයීම හා කිලෝමීටර 5 ඇතිරීම සමග ඝන මීටර මීටර 15,000 ක ගොතටුව ජලාශය සහ බූස්ටර් පොම්පාගාරය ඉදිකිරීම</u>**<br>• අන්‍යොන්‍ය එකඟතාවය මත අවසන් කොට ගෙවීම් නිරවුල් කිරීමෙන් පසුව කොන්ත්‍රාත්කරු විසින් අධිකරණ ක්‍රියාමාර්ගය ඉල්ලා අස්කරගෙන ඇති අතර දෙවන අවම ලංසුකරු වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට ප්‍රසම්පාදන ක්‍රියාවලිය මණ්ඩලය විසින් ආරම්භ කොට ඇත. | (i) කොන්ත්‍රාත් කාලය තුළ ව්‍යාපෘතිය නිම කිරීමට හැකිවන පරිදි ව්‍යාපෘතියේ කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතු වීම.<br><br>(ii) කොන්ත්‍රාත් ගිවිසුමේ විධිවිධාන සමඟ දැඩිව අනුගත වන බව සහතික විය යුතු වීම.<br><br>(iii) වැඩසටහනකට අනුව ව්‍යාපෘති කටයුතු සම්පූර්ණ කිරීමට පියවර ගත යුතු වීම.<br><br>(iv) ගිණුම්වලට ඇතුළත් කරන ලද ව්‍යාපෘතීන්හි පිරිවැයෙහි නිරවද්‍යතාවය සහතික කළ යුතු වීම. |

- ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රමාදය හේතුවෙන් කොන්ත්‍රාත්තුව 2020 අගෝස්තු 04 වන දින පිරිනමා ඇත.

<u>**අඹතලේ නිෂ්පාදන පහසුකම්හි විශ්වාසනීයත්වය දියුණු කිරීම සහ බලශක්ති ඉතුරුම් කිරීම**</u>

- ඒඑෆ්ඩී හි වර්ෂ අවසාන නිවාඩුව හේතුවෙන් අත්තිකාරම් ගෙවීම් මාස දෙකකින් ප්‍රමාද විය.
- කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්ය සාධනය හේතුවෙන් භෞතික කාර්ය සාධනය අවම වී ඇත.
- කොවිඩ් 19 වසංගතය හේතුවෙන් කොන්ත්‍රාත්තුව බලපෑමට ලක් විය.

<u>**මණ්ඩලයේ නිෂ්පාදන (බටහිර) ඒකකයට උපකරණ සහ යන්ත්‍ර සැපයුම් කිරීම**</u>

ලොට් සී සඳහා ටෙන්ඩරය යළි කැඳවුවද, කිසිදු පිරිනැමීමක් නොලැබුණු අතර ලොට් එෆ් කොන්ත්‍රාත්තුව අවසන් කර කාර්යසාධන බැඳුම්කරය මුදල් කර ගන්නා ලදී.

(ආ) පළමු කොන්ත්‍රාත්තුව අවසන් කිරීමෙන් පසුව අඹතලේ සිට එළිහවුස් ජලාශය දක්වා කිලෝමීටර් 9 ක (ඩීඅයි 1200) උපාංග සැපයුම් කිරීම හා එලීමේ කොන්ත්‍රාත්තුව 2019 නොවැම්බර් යළි ආරම්භ කොට තිබුණි. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්තුවේ ප්‍රගති වාර්තා අනුව 2019 දෙසැම්බර් 31 දිනට සමස්ත භෞතික සහ මූල්‍ය කාර්ය සාධනය පිළිවෙලින් සියයට 26.08 ක් හා සියයට 48.64 ක්ව පැවතුණි. තවද, මීටර 9000 ක එලීම් අතරින් සියයට 14.87 කට සමාන මීටර 1,338.35 ක් පමණක් 2019 දෙසැම්බර් 31 දිනට එලීම් කර තිබූ අතර 2020 ජූලි 31 දිනට එය මීටර 3347.92 ක් විය. මීටර 3347.92ක ස්ථිර මාර්ග පුනස්ථාපන එලීම් අතරින් 2020 ජූලි 31 දින වන විටත් මීටර 1019 ක එලීම් පමණක් සම්පූර්ණ කර තිබූ අතර සම්පූර්ණය කරන ලද එලීම් කටයුතු සඳහා පීඩන පරීක්ෂාවන් සිදු කොට නොතිබුණි.

(ආ) සාමාන්‍යයෙන් පීඩන පරීක්ෂාවෙන් පසුව ස්ථිර මාර්ග පුනස්ථාපනයන් සිදු කරනු ලැබේ. නමුත් මාර්ග භාවිතා කරන්නන්ගෙන් හා මාර්ග සංවර්ධන අධිකාරියෙන් එල්ල වූ මහජන ගැටළු හේතුවෙන් කොන්ත්‍රාත්කරුට කොටස් කිහිපයක ස්ථිර මාර්ග පුනස්ථාපනයන් කිරීමට සිදු විය.

කණ්ඩායම් දෙකක් විසින් කොටස් දෙකක නල එලීම් සිදු කොට තිබූ නමුත් අනපේක්ෂිත වැඩ බිම් තත්වයන් හේතුවෙන් එකදු කොටසක්වත් නිම කල නොහැකි විය.

| | | |
|---|---|---|
| (ඈ) | සුදුසු ධාරිතාවයකින් යුක්ත කාර්යක්ෂම පොම්ප සවි කිරීම මගින් බල ශක්තිය ඉතුරු කිරීම, සම්ප්‍රේෂණ අලාභ අවම කිරීම සහ අනෙකුත් නිෂ්පාදන පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා වන අඹතලේ පහසුකම් වෙනුවෙන් විශ්වාසදායක බව ඉහළ නැංවීම සහ බල ශක්ති ඉතුරුම් සඳහා වූ කොන්ත්‍රාත්තුව මුළු ව්‍යාපෘතියෙන් සියයට 45.60 ක බර තැබීමක් නියෝජනය කරනු ලබයි. කෙසේ වෙතත්, ව්‍යාපෘති කටයුතු ආරම්භයෙන් වසර 04 ක් ඉක්මවීමෙන් පසුව 2018 සැප්තැම්බර් 13 වන දින කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. කොන්ත්‍රාත්තුවේ ප්‍රගති වාර්තාව අනුව සියයට 83.96 ක් වූ ඉලක්ක ගත භෞතික ප්‍රගතියෙන් 2019 දෙසැම්බර් 31 දිනට සියයට 21.24 ක් පමණක් ලගා කර ගෙන තිබුණි. | (ඈ) වෙනස් වූ ප්‍රදානිත දිනයන්ට අනුකූලව ඉදි කිරීම් කොන්ත්‍රාත්තු පැකේජයන් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවයන්ට සරිලන පරිදි උපදේශන සේවා කාර්ය මණ්ඩලයේ මුල් සංචලන කාල සටහන වෙනස් කරන ලදී. එබැවින් උපදේශන සේවා කොන්ත්‍රාත්තුවේ ඉතුරුම් භාවිතයට ගෙන 2020 මැයි 31 දක්වා වසරක කාල පරිච්ඡේදක් සඳහා කාල දිගුවන් ප්‍රදානය කරන ලදී. |
| (ඈ) | කිලෝමීටර 5 ක් මිලි මීටර 1200 ඩීඅයි පයිප්ප සැපයීම හා ඇතිරීම සමග ගොතටුව ජලාශය සහ බූස්ටර පොම්පාගාර මධ්‍යස්ථානය ඉදි කිරීමේ නව කොන්ත්‍රාත්තුව 2020 ජුලි 31 දින වන විටත් දෙවන අවම ලංසු කරුට ප්‍රදානය කොට නොතිබූ අතර මෙම කොන්ත්‍රාත්තුව යටතේ ජලාශය සහ බූස්ටර පොම්පාගාර මධ්‍යස්ථානය ඉදි කිරීමට යෝජිත අයිඩීඑච් රෝහලේ ඉඩම අත්පත් කර ගැනීම 2013 සිට අවසන් වී නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස අයිඩීඑච් රෝහලේ කලමනාකරණය මණ්ඩලයට ඉඩම නිදහස් කිරීමට විරෝධතාවය දැක්වීම හේතුවෙන් ඉහත කී ඉදි කිරීම් අයිඩීඑච් රෝහල් පරිශ්‍රයේ සිට අඹතලේ පරිශ්‍රය දක්වා විතැන් කිරීමට යෝජනා වී තිබුණි. එමනිසා ජ්එෆ්ඩී මූල්‍ය පහසුකමේ අවසන් දිනය වූ 2022 ජනවාරි 31 දිනට ඉදි කිරීම් නිම කිරීමේ ප්‍රමාදයක් ඇති විය හැකි බව විගණනයේදී නිරීක්ෂණය විය. | (ඈ) අයිසීබී (03) කොන්ත්‍රාත්තුව අනොන්‍ය වශයෙන් අවසන් කිරීම ක්‍රියාවලිය හේතුවෙන් අයිඩීඑච් රෝහල සඳහා නිල නිවාස 06 ක් ඉදි කිරීමේ වගකීම මණ්ඩලයට සම්පූර්ණ කිරීමට නොහැකි විය. අවසානයේදී කොවිඩ් 19 වසංගතය හා අනෙකුත් සෞඛ්‍ය ගැටළු හේතුවෙන් අයිඩීඑච් කලමනාකරණය ඉහත අරමුණ වෙනුවෙන් ඉඩම නිදහස් කිරීම ප්‍රතික්ෂේප කරන ලදී. කොවිඩ් 19 වසංගතය හේතුවෙන් අයිසීබී (03) කොන්ත්‍රාත්තුව 2020 අගෝස්තු 04 වන දින දෙවන අවම ලංසුකරුට ප්‍රදානය කිරීම ප්‍රමාද විය. |
| (ඉ) | මීටර 13691 ක නල එළීම් වැඩ අවසන් වීමෙන් පසුව උඩින් කාපට් ඇතිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියට හා ප්‍රාදේශීය මාර්ග සංවර්ධන අධිකාරියට රු.මිලියන 402.8 ක් (වැට් ඇතුළුව) ගෙවිය යුතු වී තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසානයට මීටර 588 ක නල එළීම් වැඩ පමණක් අවසන් කොට තිබූ අතර රු.මිලියන 402.8 ක් එදිනට අවසන් කරන ලද වැඩ වල මුළු පිරිවැය ලෙස ගිණුම් වලට ගෙන තිබුණි. | (ඉ) මෙම ගෙවීම, ප්‍රධානිත කොන්ත්‍රාත් වටිනාකමේ කොටසක් නොවන ශ්‍රී ලංකා රජයේ දායක මුදලින් සිදුකරන ලදී. කෙසේ වෙතත් මෙම වටිනාකම ව්‍යාපෘති පිරිවැයක් වන අතර භෞතික ප්‍රගතිය තුළ දක්වා නොමැත. |

| | | | |
|---|---|---|---|
| (iii) | **<u>3.7.3 නගර ආශ්‍රිත සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (අදියර 01)</u>**<br>ව්‍යාපෘතියේ අරමුණු වනුයේ අපජලය එකතු කිරීම හා පිරිපහදු පද්ධතිය පුළුල් කිරීම, 73,000 ක් වන ජනගහනයක් සඳහා සනීපාරක්ෂක සේවාවන්ට ප්‍රවිශ්ටය වැඩි දියුණු කිරීම, ගැති-දූප්පත් ප්‍රතිපත්ති සහ උපායමාර්ග සංවර්ධනය මඟින් අවාසිදායක කුටුම්භයන් සඳහා සේවාවන්ට ප්‍රවිශ්ට වීමට පහසුකම් සැලසීම සහ වෙරළබඩ හා සමුද්‍ර පරිසර පද්ධති සංරක්ෂණය කිරීම සහ ජෛව විවිධත්වය පවත්වාගෙන යාමයි.<br>මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ. | | (i) කොන්ත්‍රාත් කාලය තුළ ව්‍යාපෘතිය නිම කිරීමට හැකිවන පරිදි ව්‍යාපෘතියේ කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතු වීම.<br><br>(ii) අනවශ්‍ය ප්‍රමාදවීම් වැළැක්වීම සඳහා නිශ්චිත කාල පරිච්ඡේදයක් සහිතව උපකොන්ත්‍රාත් ප්‍රදානයට පියවර ගත යුතු වීම. |
| (අ) | ව්‍යාපෘතිය එහි කටයුතු 2016 ජූනි 01 දින ආරම්භ කළ අතර 2022 ජූනි 30 වන දින අවසන් කිරීමට සැලසුම් කරන ලදී. කෙසේ වෙතත්, 2019 දෙසැම්බර් 31 දිනට සමස්ත භෞතික කාර්යසාධනය සියයට 4.05 ක්ව පැවතුණි. | (අ) නිර්මාණ හා අධීක්ෂණ උපදේශන සේවා කොන්ත්‍රාත්තුව (ඩීඑස්සී) ප්‍රදානය කිරීමේ මූලික ප්‍රසම්පාදන ප්‍රමාදයක් විය. උපදේශකයින් සේවයෙන් මිදීම, ඩ්‍රෝන සමීක්ෂණ තහනම් කිරීම, රටවල් කිහිපයක් විසින් පනවන ලද ගමන් තහනම් සහ 2019 අගෝස්තු 21 සිදුවීමත් සමඟ වූ ආරක්ෂක ගැටළු, පවතින කොවිඩ් 19 වසංගතය සහ ඉඩම් අත්පත් කර ගැනීමේ ගැටළු යනාදිය හේතුවෙන් විස්තරාත්මක නිර්මාණ වැඩ ප්‍රමාද විය. ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය තවම සිදුවෙමින් පවතින අතර දැඩි මහජන විරෝධයන් සහ අයිතිකරුවන්ගේ විරෝධයන් හේතුවෙන් ප්‍රමාද වේ. | |
| (ආ) | ප්‍රතිපත්ති සහ ආයතනික වැඩිදියුණු කිරීමේ උපදේශන සේවා කොන්ත්‍රාත්තුවේ (පීඅයිඊසී) උපදේශකවරුන් විසින් ලංසු ලේඛන පිළියෙල කිරීමේ ප්‍රමාදය හේතුවෙන් අපජල කළමනාකරණ හැකියා සංවර්ධනය කිරීමේ උපදේශන සේවා කොන්ත්‍රාත්තුව (එස්එම්එස්ඩීසී) 2020 ජූනි 30 දින වන විටත් ප්‍රදානය කොට නොතිබුණි. | (ආ) මූලික ප්‍රසම්පාදන ප්‍රමාදය හේතුවෙන් පීඅයිඊසී කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම ප්‍රමාද වීම එස්එම්එස්ඩීසී හි වැඩ ආරම්භ කිරීම ප්‍රමාදයට දායක විය. | |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මීගමුව අපජල කළමනාකරණ පද්ධතිය සඳහා පොම්පාගාර ඇතුළු රැස් කිරීමේ පද්ධතිය ඉදිකිරීම හා මීගමුවේදී අපජල පිහිපහදු පිරියත නිර්මාණය කිරීම හා ඉදිකිරීම නම් වූ අනෙකුත් කොන්ත්‍රාත්තු දෙකක්ද ව්‍යාපෘති කාල පරිච්ඡේදය තුළදී නිම කිරීමට අපේක්ෂා කොට තිබුණි. කෙසේ වෙතත්, 2020 ජූනි 30 දිනටත් එම කොන්ත්‍රාත් ප්‍රදානය කොට නොතිබුණි. | (ඇ) නිර්මාණය කිරීම හා අධීක්ෂණය කිරීමේ උපදේශන සේවා කොන්ත්‍රාත්තුවෙහි (ඩීඑස්සී) ප්‍රසම්පාදනය ප්‍රමාද වීම හේතුවෙන් වූ මූලික ප්‍රමාදය සහ ඒ අනුව වැඩ කොන්ත්‍රාත්තු 2020 නොවැම්බර්හිදී ප්‍රදානය කිරීමට සැලසුම් කොට තිබුණි. 2020 අවසානයට පෙර උපදේශකයින් විසින් ලංසු ලේඛන නිම කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. | |
| (iv) | <u>**3.7.4 කුණ්ඩසාල හාරගම ජලසම්පාදන ව්‍යාපෘතිය**</u><br><br>පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ. | | |
| (අ) | ව්‍යාපෘතිය සම්බන්ධ ප්‍රසම්පාදන කටයුතු 2011 වර්ෂය තුළදී ආරම්භ කොට තිබූ අතර කොන්ත්‍රාත් ගිවිසුම සහ මූල්‍ය ගිවිසුම අත්සන් කිරීම සඳහා පිළිවෙලින් වසර හතරක් සහ වසර පහක කාලයක් ගතකර තිබුණි. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්කරුගේ මූල්‍යමය නොහැකියාව සහ අත්තිකාරම් සුරක්ෂණය සහ කාර්යසාධන බැඳුම්කරය ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම හේතුවෙන් කොන්ත්‍රාත්තුව 2016 මාර්තු මසදී අවසන් කොට තිබුණි. | (අ) කොන්ත්‍රාත්කරුගේ මූල්‍යමය නොහැකියාව හේතුවෙන් කොන්ත්‍රාත්තුව අවසන් කරන ලදී. | (i) අවසන් කරන ලද කොන්ත්‍රාත් සඳහා ප්‍රමාදයකින් තොරව නව කොන්ත්‍රාත් ප්‍රදානය කළ යුතු වීම.<br><br>(ii) කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කිරීමට පෙර අවශ්‍ය අවස්ථාවන්හිදී නීතිපතිවරයාගේ එකඟතාවය ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | කොන්ත්‍රාත්තුව මූලිකව 2016 දී ප්‍රදානය කොට තිබූ අතර එය අවසන් කොට තිබුණි. කෙසේ වෙතත්, අකාර්යක්ෂම ප්‍රසම්පාදන පටිපාටිය හේතුවෙන් නැවත 2019 ජූනි හිදී නව කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට තවත් වසර 03 ක් ගත කර තිබුණු අතර එය නීතිපතිවරයාගේ එකඟතාවය ලබා ගැනීමකින් තොරව ප්‍රදානය කොට තිබුණි. | (ආ) දීර්ඝ තාක්ෂණික හා මූල්‍යමය ඇගයීම්වලින් හා සාකච්ඡාවලින් පසුව 2019 මැයි 28 දිනැති කැබිනට් අනුමැතියත් සමඟ 2019 ජූනි 14 දින කොන්ත්‍රාත්තු ප්‍රදානය කරන ලදී. පසුව, නීතිපති දෙපාර්තමේන්තුවේ එකඟතාවයට යටත්ව 2019 ඔක්තෝම්බර් 14 වන දින කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කරන ලදී. | |
| v. | <u>**3.7.5 මහ කොළඹ ජල පුනරුත්ථාපන ව්‍යාපෘතිය**</u><br>නව කාර්යාල ගොඩනැගිලි සංකීර්ණයක් සහ මාළිගාකන්දේහිදී නව ජලාශයක් ඉදිකිරීම, එළිහවුස් නව ජලාශයක් ඉදිකිරීම, කොටිකාවත්ත හා මුල්ලේරියාව ජල සැපයුම් පද්ධතිය වැඩිදියුණු කිරීම සහ කොළඹ තෝරාගත් කුලී නිවැසියන්ට ජල සම්බන්ධතා ලබා දීම මගින් කොළඹ නගරය සහ | | (i) කොන්ත්‍රාත් කාලය තුළ ව්‍යාපෘතිය නිම කිරීමට හැකිවන පරිදි ව්‍යාපෘතියේ කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | කොට්කාවත්ත මුල්ලේරියාව ප්‍රදේශය පුනරුත්ථාපනය හා ජල සැපයුම වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ මූලික අරමුණු වේ.<br>මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ. | | (ii) අධිකාරියක් නොලත් ගණුදෙනු වැළැක්වීම සඳහා පියවර ගත යුතු වීම.<br><br>(iii) කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි සමඟ අනුගත වන බව සහතික විය යුතු වීම. |
| (අ) | ව්‍යාපෘතිය එහි කටයුතු 2007 නොවැම්බර් 27 දින ආරම්භ කළ අතර 2012 ජනවාරි වන විට නිමකිරීමට සැලසුම් කර ඇත. අනතුරුව ව්‍යාපෘති කටයුතු නිම කිරීමේ ප්‍රමාදය හේතුවෙන් ව්‍යාපෘති කාලය 2017 ජූනි 20 දක්වා දීර්ඝ කර තිබුණි. තවද, 2015 ජූනි 20 දින ණය ගිවිසුම අවසන් වීම හේතුවෙන් ඉතිරි ඉදිකිරීම් නිම කිරීමේ පිරිවැය වෙනුවෙන් රු. මිලියන 346.59 ක් 2015 දී කොන්ත්‍රාත්කරුගේ ගිණුමකට මාරුකර තිබුණු බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, ඒ සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබාගෙන නොතිබුණි. | (අ) ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හා රේඛීය අමාත්‍යාංශය හරහා එකී ගිවිසුමට අදාළ සංශෝධනයන් ජපාන අන්තර්ජාතික සහයෝගීතා නියෝජිත ආයතනය වෙත එකඟතාවය සහ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. ජයිකා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා ඊට එකඟතාවය ලබා දෙන ලදී.<br><br>ජපාන අන්තර්ජාතික සහයෝගීතා නියෝජිත ආයතනය අදාළ අත්තිකාරම් අරමුදල කොන්ත්‍රාත්කරු ලබාදී ඇති නිල ගිණුමට කොන්දේසි විරහිත බැංකු ඇපකර ඉදිරිපත් කිරීම මත මාරු කර ඇත. | (iv) වැඩසටහනට අනුව ව්‍යාපෘති ක්‍රියාකාරකම් නිම කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වීම.<br><br>(v) වලංගු කල්බදු ගිවිසුමක් මත ඉඩම් සඳහා වන කල්බදු කුලිය ගෙවිය යුතු වීම.<br><br>(vi) කල්බදු ඉඩම් සඳහා වලංගු කල්බදු ගිවිසුමකට එළඹිය යුතු වීම. |
| (ආ) | මුල්වැඩ සැලසුම තුළ අන්තර්ගත නොවූ කාර්යාල ගොඩනැගිලි දෙකක් රු.මිලියන 180.41 ක පිරිවැයකට කොලොන්නාවේ හා මාළිගාකන්දේ ව්‍යාපෘතිය විසින් ඉදිකර තිබූ අතර කල් බදු ගිවිසුමකට එළඹීමකින් තොරව එකතුව රු. මිලියන 5.17 ක කල්බදු කුලියක් කොලොන්නාව දිස්ත්‍රික් ලේකම් වෙත 2018 දෙසැම්බර් 31 දක්වා ගෙවා තිබුණි. තවද, අදාළ ගොඩනැගිලි 2015 වර්ෂයේ සිට කොළඹ මහ නගර සභා කාර්යමණ්ඩල ප්‍රයෝජනය සඳහා ඉඩහැර තිබුණි. | (ආ) කොලොන්නාව කල්බදු ගිවිසුම, කොලොන්නාව දිස්ත්‍රික් ලේකම්ගේ සම්බන්ධීකරණයත් සමඟ මණ්ඩලයේ ඉඩම් අංශය විසින් සකස් කරමින් පවතී. කොලොන්නාව කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම ව්‍යාපෘතියේ මුල්වැඩ සැලැස්ම තුල අන්තර්ගත නොවීය. නමුත් අනතුරුව මණ්ඩලයේ අවශ්‍යතාවය මත කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් කොට විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හා රේඛීය අමාත්‍යාංශය හරහා ජයිකා එකඟතාවය ලබාගෙන ඇත.<br><br>මාළිගාකන්ද ඉඩම සඳහා වන කල්බදු ගිවිසුම 2009 වර්ෂය සිට පවතී. එමෙන්ම රු.මිලියන 151 ක ගෙවීම් කල්බදු ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව සිදු කර ඇත. කල්බදු ගිවිසුමේ | |

| | | | |
|---|---|---|---|
| | | කොන්දේසි ප්‍රකාරව ගොඩනැගිල්ලේ කොටසක් කොළඹ මහනගර සභා කාර්යමණ්ඩලයේ ප්‍රයෝජනය සඳහා ඉඩහැර තිබුණි. | |
| (ඈ) | කොටිකාවත්ත සහ මුල්ලේරියාව ජල සම්පාදනය වැඩි දියුණු කිරීමට රු. මිලියන 258.10 ක පිරිවැයකින් අඹතලේ ජල පොම්පාගාරයක් (ප්‍රමාණ පත්‍රය තුළ පිරිවැය දී නොතිබුණි.) සහ ගොතටුව භූගත ජලාශයක් ඉදිකිරීමට සැලසුම් කොට තිබුණි. කෙසේ වෙතත්, එය සිදු කර නොතිබුණි. | (ඈ) පොම්පාගාරයක් සහ ගොතටුව භූගත ජලාශයක් ඉදිකිරීමට සැලසුම් කොට තිබුණද, විචල්‍ය වේග ධාවක නව තාක්ෂණ වැඩ පිළිවෙල යටතේ භූගත ජලාශය සහ පොම්පාගාරය ඉදිකිරීමේ පිරිවැය ඉතිරි කර ගැනීමට අපට හැකි විය. | |
| vi. | **<u>3.7.6 මහනුවර අපජල කළමනාකරණ ව්‍යාපෘතිය</u>**<br>ජනාකීර්ණ ප්‍රදේශවල යළි පුනරුත්ථාපනය හා සනීපාරක්ෂක පහසුකම් ඇතුළත්ව මහනුවර පිරිපහදු හා අපජලය එකතු කිරීම, පිරිපහදු කිරීම හා බැහැර කිරීම සඳහා නිසි ක්‍රමවේදයක් සකස් කිරීම හා එමඟින් එම ප්‍රදේශවල මිනිසුන්ගේ ජීවන තත්ත්වය, සෞඛ්‍ය හා සුබ සාධනය ඉහළ නැංවීම මඟින් ජීවන පරිසරය සහ මහවැලි ගඟේ ජලයේ ගුණාත්මකබව වැඩි දියුණු කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ විය.<br>මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ. | | (i) කොන්ත්‍රාත් කාලය තුළ ව්‍යාපෘතිය නිම කිරීමට හැකිවන ලෙස ව්‍යාපෘතියේ කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතු වීම.<br><br>(ii) කොන්ත්‍රාත් ගිවිසුමේ විධිවිධාන සමඟ අනුගත වන බවට සහතික විය යුතු වීම.<br><br>(iii) වැඩසටහනකට අනුව ව්‍යාපෘති කටයුතු සම්පූර්ණ කිරීමට පියවර ගත යුතු වීම.<br><br>(iv) ඉදිකිරීම් ආරම්භයට පෙර යෝජිත ඉඩම් අත්පත් කර ගත යුතු වීම. |
| (අ) | ව්‍යාපෘතිය එහි කටයුතු 2010 පෙබරවාරි 03 දින ආරම්භ කරන ලද අතර 2017 සැප්තැම්බර් වන විට නිම කිරීමට සැලසුම් කොට තිබුණි. අනතුරුව ව්‍යාපෘති කාලය 2022 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණි. | (අ) 2017 ජූනි සිට 2021 ජූලි දක්වා දින 1470 කින් ව්‍යාපෘතිය ප්‍රමාද වීමට හේතු වූයේ<br>• ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රමාදයන්<br>• නිර්මාණය කිරීම්, අමුද්‍රව්‍ය සැපයීම් හා ඉදිකිරීමේදී වූ කොන්ත්‍රාත්කරුගේ ප්‍රමාදයන්<br>• නිර්මාණ සංශෝධනයන් හේතුවෙන් ඇතිවූ ප්‍රමාදයන්<br>• විවිධ ආයතනයන්ගේ මැදිහත් වීම් හා අනපේක්ෂිත හේතුන් මත සිදු වූ ප්‍රමාදයන් | |

| | | | |
|---|---|---|---|
| | | • විශේෂයෙන් අයහපත් කාලගුණ තත්වයන් යනාදියෙන් සිදු වූ ප්‍රමාදයන් | |
| (ආ) | අඩු ආදායම් ලාභී කණ්ඩායම් සඳහා සනීපාරක්ෂක පහසුකම් සැපයීමේ කොන්ත්‍රාත්තුව 2018 මාර්තු 21 දින නිම කර තිබූ අතර වගකීම් කාලය 2019 මාර්තු 21 අවසන් විය. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය විසින් ඉස්මතු කරන ලද අඩුපාඩු නිවැරදි කිරීම සඳහා 2019 අගෝස්තු 30 දින වන විටත් කොන්ත්‍රාත්කරු යොමු වී නොතිබුණි. | (ආ) අඩුපාඩු දැනුම් දීමේ කාල පරිච්ඡේදය දීර්ඝ කළ නමුදු අඩුපාඩු සඳහා කොන්ත්‍රාත්කරු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. එබැවින් සියලුම දුර්වලතා සහ වගකීම් ආවරණය කිරීමට නුවර මහ නගර සභාවෙන් රු.1,881,655 ක ඇස්තමේන්තුවක් ලබාගෙන ඇත. රු.5,095,377.76 ක් වන කොන්ත්‍රාත්කරුගේ කාර්යසාධන සුරක්ෂණය මුදල් කරගන්නා ලද අතර ඇස්තමේන්තු ගත වටිනාකම නුවර මහනගර සභාව වෙත ගෙවන ලදී. | |
| (ඇ) | ව්‍යාපෘතිය විසින් මහනුවර දියනවෙල, ආලෝක රෝහල් පරිශ්‍රය සහ මහනුවර මහානාම ප්‍රාථමික විද්‍යාලයීය පරිශ්‍රය තුළ පොම්පාගාරය ඉදිකිරීම, අදාළ ඉඩම්වල හිමිකම් ඔප්පුව පවරා ගැනීමකින් තොරව ආරම්භ කොට තිබුණි. | (ඇ) ඉඩම් ගැටලු විසඳීමට දීර්ඝ කාලයක් ගත වේ. | |
| vii. | **<u>3.7.7 ගිරිදර ජල සම්පාදන ව්‍යාපෘතිය</u>** | | |
| | පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ. | | |
| (අ) | දොම්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 20,000 ක ජනගහනයකට පානීය ජලය ලබාදීම සඳහා ව්‍යාපෘතිය එහි කටයුතු 2019 පෙබරවාරි 15 දින ආරම්භ කොට තිබූ අතර 2020 පෙබරවාරි 14 දින නිම කිරීමට සැලසුම් කොට තිබුණි. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්කරුගේ දුර්වල මූල්‍ය කාර්ය සාධනය සහ අවශ්‍ය ශ්‍රමය සහ උපකරණ යෙදවීමට නොහැකියාව හේතුවෙන් 2020 අගෝස්තු 14 දක්වා ව්‍යාපෘති කාලය දීර්ඝ කොට තිබුණි. කෙසේ වෙතත්, 2020 ජූලි 31 දිනට භෞතික ප්‍රගතිය සියයට 31 ක් පමණක්ව පැවතුණි. | (අ) දැනට 2020 නොවැම්බර් 04 දක්වා කොන්ත්‍රාත්තුව දීර්ඝ කර ඇති අතර කාර්යසාධනය ඉහළ නංවන ලෙස කොන්ත්‍රාත්කරුට දැනුම් දී ඇත. නමුත් ඇතැම් හේතූන් මත කාර්යසාධනය තවමත් සියයට 32 ක පහළ මට්ටමක පවතී. | (i) කොන්ත්‍රාත් කාලය තුළ ව්‍යාපෘතිය නිම කිරීමට හැකිවන පරිදි ව්‍යාපෘතියේ කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතු වීම.<br><br>(ii)කොන්ත්‍රාත්කරුවන්ගේ දුර්වල කාර්යසාධනය සඳහා කාල දිගුවන් ප්‍රදානය කිරීම වෙනුවට කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව ප්‍රමාද ගාස්තු අය කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වීම. |
| (ආ) | අකාර්යක්ෂම ප්‍රසම්පාදන ක්‍රියාවලිය හේතුවෙන් ලංසුකරුවන්ගෙන් අභිලාෂයන් කැඳවීමට සහ තෝරාගත් ලංසුකරුට කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා ආසන්න වශයෙන් | (ආ) වැඩ විෂය පථය සහ මූලාශ්‍ර වෙනස්වීම හේතුවෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලිය ප්‍රමාද විය. | |

| | | | |
|---|---|---|---|
| | වසර හතරක (04) කාලයක් ගත වී තිබුණි. තවද, 2014 පෙබරවාරි මාසයේදී අභිලාෂයන් කැඳවන විට සකස් කරන ලද රු. මිලියන 585.95 ක ඉංජිනේරු ඇස්තමේන්තුව සාධාරණ හේතුවකින් තොරව ටෙන්ඩරය නැවත කැඳවන අවස්ථාව වන විට රු. මිලියන 875.3 දක්වා වැඩි කර තිබුණි. | | (iii) ව්‍යාපෘති අරමුණ කාලීනව ලගා කර ගැනීමට ප්‍රසම්පාදන ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතු වීම. |
| (ඇ) | කොන්ත්‍රාත්තුව ඉංජිනේරු ඇස්තමේන්තුවෙන් සියයට 29.71 කට වඩා අඩුවූ රු. මිලියන 513.28 ක කොන්ත්‍රාත් වටිනාකමකට තෝරාගත් ලංසුකරුට පිරිනමා තිබුණු නමුදු රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.9.11 (අ) ඡේදයේ ප්‍රකාරව ලංසුකරු විසින් එම අයිතමයන් (වැඩ හා සේවා) දක්වා ඇති රේටයන්ට අනුව ප්‍රසම්පාදනය කිරීමට අදහස් කරන්නේ කෙසේද යන්න සනාථ කිරීමට අනුපාත විශ්ලේෂණයක් තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් කොන්ත්‍රාත්කරුගෙන් ලබාගෙන නොතිබුණි. | සටහන් කර ගන්නා ලදී. | (iv) කාල පරිච්ඡේදය තුළ ව්‍යාපෘතිය නිම කිරීම සඳහා වෙනත් ආයතනයන්ගෙන් අවශ්‍ය අනුමැතීන් හැකි ඉක්මනින් ලබා ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතු වීම.<br><br>(v) රජයේ මාර්ගෝපදේශ සංග්‍රහය, පිඩික් මාර්ගෝපදේශය හා කොන්ත්‍රාත් කොන්දේසි සමඟ අනුගත වන බවට සහතික විය යුතු වීම. |
| (ඈ) | කලටුවාව ජල සම්පාදන යෝජනා ක්‍රමයේ සිට ජල සැපයුම ලබා ගැනීමේ මිදුම් ස්ථානය ලෙස හංවැල්ල පාලම හඳුනාගෙන ඇති නමුදු පාලම හරහා නල එළීමට මාර්ග සංවර්ධන අධිකාරියේ අනුමැතිය 2020 ජනවාරි 16 වන විටත් ලබාගෙන නොතිබුණි. | (ඈ) මෙම කාරණය මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂක/ ඉංජිනේරු සේවා සමඟ 2020 සැප්තැම්බර් 08 දින සාකච්ඡා කර ඇති අතර එස්ඩීඇන්ඩ්සීසී විසින් සිදු කරනු ලබන පාලමේ නඩත්තුව කොවිඩ් 19 තත්වය සහ වරින්වර වෙනස්වන ගඟෙහි ජල මට්ටමෙහි තත්වය හේතුවෙන් ප්‍රමාද වී ඇති බව ඔහු විසින් දැනුම් දී ඇති අතර එම කාර්ය තවමත් අවසන් වී නොමැත. | (vi) කොන්ත්‍රාත් ප්‍රදානයට පෙර කොන්ත්‍රාත්කරුවන්ගේ පූර්ව කාර්යසාධනය ඇගයීම් නිර්ණායකයක් ලෙස යොදාගත යුතු වීම. |
| (ඉ) | වටිනාකම රු.7,736,256 ක් වන මිලිමීටර 160 විෂ්කම්භයෙන් යුත් මීටර 3996 ක පයිප්ප, රු.මිලියන 74.43 අත්තිකාරම් ඔහු වෙත ගෙවා තිබෙන විටදී පවා මණ්ඩලය විසින් ණය පදනම මත කොන්ත්‍රාත්කරුට සපයා තිබුණි. කෙසේ වෙතත්, රු.4,832,256 ක් වටිනා පයිප්ප නිරවුල් කිරීමට 2020 ජනවාරි 16 වන විටත් කොන්ත්‍රාත්කරු අපොහොසත් වී තිබුණි. | (ඉ) සංචලන අත්තිකාරම් භාවිතා කොට පයිප්ප මිලදී ගැනීමට මාස කිහිපයක් ගත විය හැකි බැවින් කාර්යයන් කඩිනමින් ආරම්භ කිරීම සඳහා කොන්ත්‍රාත්කරු විසින් පයිප්ප කිහිපයක් සහ අනෙකුත් අමුද්‍රව්‍ය ණය පදනම මත ඉල්ලුම්කර තිබූ අතර සාමාන්‍යාධිකාරීගේ අනුමැතිය මත මේවා කොන්ත්‍රාත්කරුට නිකුත් කර ඇත. | |

| | | | |
|---|---|---|---|
| (ඊ) | තෝරාගත් කොන්ත්‍රාත්කරුට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන අවස්ථාව වන විට පොලොන්නරුව දිස්ත්‍රික්කයේ පිබිදෙමු පොලොන්නරුව සංවර්ධන වැඩසටහන සඳහා පයිප්ප සැපයුම් කිරීම සහ ඇතිරීමත්, මැදිරිගිරිය ජල සම්පාදන ව්‍යාපෘතිය (අදියර III) සඳහා ඝන මීටර 9000 ක ධාරිතාවයකින් යුතු ජල පිරිපහදු මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා වන කොන්ත්‍රාත්තුව යන තවත් කොන්ත්‍රාත් දෙකක් එකඟ වූ කාලය තුළ නිම කිරීමට කොන්ත්‍රාත්කරු අපොහොසත් වී තිබූ බව නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, එම කොන්ත්‍රාත්කරුටම මෙම කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන විට එය සැලකිල්ලට ගෙන නොතිබුණි. | (ඊ) පසු ඇගයීම් මත වන කොන්ත්‍රාත්කරුගේ නුසුදුසු කම කොන්ත්‍රාත්කරුගේ අභියෝගයට ලක්විය හැක. එබැවින් එය මණ්ඩලයට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට මුල් විය හැක. | |

viii. **<u>3.7.8 කොළඹ දිස්ත්‍රික් නගර නැගෙනහිර ජල සම්පාදන ව්‍යාපෘතිය - අදියර 01 සහ 03</u>**

පාදුක්ක, සීතාවක, හොරණ සහ හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් ආවරණය වන පරිදි කිලෝමීටර් 176 ක් සඳහා බෙදාහැරීමේ ප්‍රධාන නල එළීම මගින් හා කිලෝමීටර් 4ක් සඳහා සම්ප්‍රේෂණ නල එළීම මගින් ජලය සැපයීම සඳහා ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතියේ ප්‍රමාණ පත්‍රයට පටහැනිව ඉහත ව්‍යාපෘතියේ අදියර 1 සහ 3 හි පසුපිරවුම් සඳහා භාරන ලද පස්ම යොදා ගැනීම හේතුවෙන් මීටර 267,188 ක තාවකාලික මාර්ග පුනස්ථාපනයන් සඳහා රු. මිලියන 732.07 ක වැඩිපුර ගෙවීමක් සිදු කර තිබුණි. | (අ) තාවකාලික පුනස්ථාපනයන් සඳහා ආනයනික පස් භාවිතා කිරීම අනිවාර්ය නොවේ. කොන්ත්‍රාත්තුව ප්‍රකාරව භාරන ලද පස් හෝ ආනයනික පස් භාවිතා කරමින් තාවකාලික පුනස්ථාපනයන් සිදු කල හැකිය. | (i) කොන්ත්‍රාත් ගිවිසුමෙහි විධිවිධාන සමඟ අනුගත වන බව සහතික විය යුතු වීම.<br><br>(ii) කොන්ත්‍රාත් කාල සීමාව තුළ ව්‍යාපෘතිය අවසන් කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතු වීම. |
| (ආ) | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ 2018 වර්ෂයේ පැවති අනුපාතයන් හා සන්සන්දනය කිරීමේදී, අදියර (III) සඳහා ආනයනික ජල මනු 10,000 ක් වෙනුවෙන් රු. මිලියන 79.79 ක වැඩිපුර ගෙවීමක් සිදු කර තිබුණි. | (ආ) SCAPC නිර්දේශ සමඟ TEC ඇගයීම් මත පදනම්ව කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර ඇත. ක්‍රියාත්මක කාලය තුළ ජල මනු සඳහා ප්‍රමාණපත්‍ර අනුපාත සංශෝධනය කිරීමේ අධිකාරියක් ව්‍යාපෘති කාර්ය මණ්ඩලය සතු නොවේ. | (iii) ව්‍යාපෘතිය ඇගයීම් අදියරේදී කොන්ත්‍රාත්කරුට අසාමාන්‍ය අනුපාතයන් ගෙවීම වැළැක්වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පිත්තල කොපුව ජල මනුවෙහිම කොටසක් වන අතර එය ජල මනුව සමඟ සැපයුම් කරන නමුදු එය ප්‍රමාණ පත්‍රය තුළ වෙනමම ඇතුළත් කර තිබුණි. එබැවින් අදියර I සහ III වෙනුවෙන් පිත්තල කොපු සැපයීම සඳහා රු. මිලියන 25.32 ක වෙනම ගෙවීමක් සිදු කර තිබුණි. | (ඇ) ජල මනු සහ පිත්තල කොපු සඳහා වෙනම අයිතමයන් ප්‍රමාණ පත්‍රයෙහි ඇත. පිත්තල කොපු සමඟ ජල මනු එක් ඒකකයක් ලෙස මිලදී ගැනීමේදී සැපයුම් අයිතමයන් විස්තරාත්මකව ජල මනු සහ සම්බන්ධිත කොටස් ඇතුළත් කිරීම මණ්ඩලයේ භාවිතය වේ.<br>කෙසේ වෙතත්, අදියර 01 හා 03 හි ප්‍රමාණ පත්‍රයන් සම්බන්ධයෙන් විස්තර ඉදිරිපත් කොට නොමැති අතර ජල මනු සහ පිත්තල කොපු වෙනම අයිතමයන් ලෙස ඉදිරිපත් කර ඇත.<br>ඒ අනුව, ප්‍රමාණ පත්‍රයේ ඉදිරිපත් කොට ඇති ප්‍රමාණයන් ප්‍රකාරව සේවා සම්බන්ධතා අමුද්‍රව්‍යාන් සැපයීම සඳහා අනුමැතිය ලබාදී ඇති අතර කොන්ත්‍රාත් දෙකෙහි එකිනෙකට වෙනස් අන්තර් ගෙවීම් සහතික පත් මගින් ගෙවීම් වෙන වෙනම සිදු කර ඇත. | |

**3.8 වෙනත් සංවිධානවලට මුදාහළ සම්පත්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | 2003 ජුනි 02 දින අංක පීඒඩී/12 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තියේ විධිවිධානවලට පටහැනිව, 2019 දෙසැම්බර් 31 දින වන විට සේවකයින් දහ නවදෙනෙකු (19) රේඛීය අමාත්‍යාංශයට මුදා හැර ඇති අතර එයින් සේවකයින් 18 දෙනෙකු සඳහා මණ්ඩලය විසින් රු.22,025,414 සමාලෝචිත වර්ෂය තුළදී වැය කර තිබුණි. ඒ අනුව, 2015 දෙසැම්බර් සිට 2019 දෙසැම්බර් 31 දක්වා මණ්ඩලයෙන් නිදහස් කරන ලද සේවකයින් සඳහා රු.168,449,077 ක් ජල සම්පාදන අමාත්‍යාංශය විසින් ප්‍රතිපූරණය කළ යුතුව ඇත. | හදිසි තාක්ෂණික හා වෙනත් කාර්යයන් සඳහා කාර්ය මණ්ඩලය නිදහස් කරන ලෙස රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ඉල්ලීම් කළ විට, ඔවුන් තාවකාලිකව අමාත්‍යාංශයට මුදා හරිනු ලැබේ.<br>කෙසේ වෙතත්, එකී වේතන ප්‍රතිපූරණය කිරීම සඳහා අවශ්‍ය අයවැය ප්‍රතිපාදන ඔවුන් සතුව නොමැති බව අමාත්‍යාංශය විසින් දැනුම් දී ඇත. | වෙනත් ආයතනවලට සම්පත් නිදහස් කිරීම සම්බන්ධයෙන් 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඒඩී/12 හි ඇති විධිවිධානවලට අනුගත වන බව සහතික විය යුතු වීම. |
| ii. | තවද 2019 ජනවාරි සිට නොවැම්බර් දක්වා මෝටර් වාහන හතක් (07) රේඛීය අමාත්‍යාංශය වෙත නිදහස් කර තිබූ අතර එම වාහනවල නඩත්තු බලපත්‍ර සහ රක්ෂණය වෙනුවෙන් රු.379,125 ක් වැය කර තිබුණි. | 2019.12.31 දිනට වාහන තුනක් පමණක් අමාත්‍යාංශයට නිදහස් කර ඇත. | වෙනත් ආයතනවලට සම්පත් මුදා හැරීම සම්බන්ධයෙන් 2003 ජුනි 02 දිනැති අංක පීඒඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සමඟ අනුගත වන බවට සහතික විය යුතු වීම. |

## 3.9 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | අතිරේක සාමාන්‍යාධිකාරී (සාමූහික සේවා) සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන් යන උපායමාර්ගික මට්ටමේ තනතුරුද, කළමනාකරුවන්/ ඉංජිනේරු (යාන්ත්‍රික), ඉංජිනේරු (විදුලි), ඉංජිනේරු (සිවිල්), යනාදී ප්‍රධාන මෙහෙයුම් මට්ටමේ තනතුරුද, මධ්‍යම මට්ටමේ තාක්ෂණික (එම්එල්-ටී) ලිපිකරු සහ සමාන්තර ශ්‍රේණි වර්ගයන් සහ වෙනත් පුහුණු ශ්‍රේණි ආදී ඇතුළත්ව පුරප්පාඩු 969 ක් පිරවීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම මණ්ඩලය විසින් පියවර ගෙන නොතිබුණි. | ඇතැම් කාර්යයන් ස්වයංක්‍රීයකරණය කිරීම, මිනිස් බල ගිවිසුම් යටතේ සේවකයින් කුලී පදනම මත යොදා ගැනීම, වාරණ නියෝග, පිරිවැය පාලන යාන්ත්‍රණයක් වශයෙන් සහ දැනට ඇති කාර්ය මණ්ඩලය කාර්යක්ෂම ලෙස උපයෝජනය පුරප්පාඩු නොපිරවීමට හේතු විය. | මණ්ඩලයට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් බඳවා ගත යුතු වීම. |
| ii. | 2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ දක්වා ඇති පරිදි බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතිය ලබා ගැනීමට පියවර ගෙන නොතිබුණි. | සමාලෝචනය කිරීමට කමිටුවක් පත්කර ඇති අතර එහි කටයුතු සිදු වෙමින් පවතී. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් බඳවා ගැනීම් හා උසස් කිරීම් පටිපාටිය සඳහා අනුමැතිය ලබා ගැනීම සඳහා පියවර ගත යුතු වීම. |
| iii. | මොනරාගල සහ මාතර කළමනාකරණ කාර්යාල සහ දකුණු ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානය විසින් සේවකයින් හැත්තෑවක් (70) පිටස්තර ආයතනවලින් කම්කරුවන් ලෙස ලබා ගෙන මනුසටහන්කරු, පොම්ප ක්‍රියාකරු සහ ලිපිකරු යනාදී වශයෙන් සේවයේ නියුක්ත කොට තිබුණි. | අත්‍යාවශ්‍ය කාර්යයන් වීම හේතුවෙන් ඔවුන් එකී ආයතනවලින් බඳවා ගන්නා ලදී. | සේවා කොන්ත්‍රාත් ගිවිසුම් යටතේ කුලී පදනම මත ලබාගත් කම්කරුවන් මණ්ඩලයේ වගකිව යුතු තනතුරු සඳහා පත්කිරීම වැළැක්වීමට ක්‍රියාමාර්ග ගත යුතු වීම. |
| iv. | සමාජ විද්‍යාඥ, සිවිල් ඉංජිනේරු සහකාර හා යන්ත්‍ර ක්‍රියාකරුවෙකු සමාලෝචිත වර්ෂය අවසානයට කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණි. | අනුමත කාර්ය මණ්ඩලය තුළ එවැනි බඳවා ගැනීම් සිදුකිරීමට හැකියාව තිබුණි. | ඉහළ සහ මධ්‍යම කළමනාකරණ මට්ටමේ තනතුරු ස්ථිර සේවකයන්ගෙන් පිරවිය යුතු වීම. |
| v. | පසුගිය වසර පහ තුළ එක් සේවකයෙකුගේ මුළු පිරිවැය පහත පරිදි වේ. | සටහන් කරගන්නා ලදී. | කාර්ය මණ්ඩල පිරිවැය හැකිතාක් පාලනය කිරීමට පියවර ගත යුතු වීම. |

| වර්ෂය | මුළු සේවක සංඛ්‍යාව | මුළු සේවක පිරිවැය රු.මිලියන | එක් සේවකයෙකු සඳහා පිරිවැය රු.මිලියන |
|---|---|---|---|
| 2015 | 10245 | 10,684.59 | 1.04 |
| 2016 | 10352 | 11,412.87 | 1.10 |
| 2017 | 10338 | 11,575.10 | 1.12 |
| 2018 | 10022 | 12,863.07 | 1.28 |
| 2019 | 10104 | 12,862.19 | 1.27 |

ඒ අනුව 2015 සිට 2018 දක්වා කාල පරිච්ඡේදය තුළ ඒකක සේවක පිරිවැය ක්‍රමිකව වැඩි වී තිබුණු බව නිරීක්ෂණය විය.

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි, සහකාර සාමාන්‍යාධිකාරි, ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන් පස් දෙනෙකු (05) සහ ඉංජිනේරුවෙකු ඇතුළුව අභ්‍යන්තර විගණන අංශයේ පුරප්පාඩු දහ හතරක් (14) පවතී. කෙසේවෙතත්, 2020 ජූලි 31 දිනටත් එම පුරප්පාඩු පිරවීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | දැනට පවතින නඩු කටයුත්තක් හේතුවෙන් ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන් බඳවා ගැනීම අපේක්ෂාවෙන් සිටියි. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි සහ සහකාර සාමාන්‍යාධිකාරි යන අනෙක් තනතුරු දෙක සඳහා නුදුරු අනාගතයේදී බඳවා ගැනේ. | ප්‍රමාණවත් අභ්‍යන්තර විගණන කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීම අවශ්‍ය වන අතර විශේෂයෙන්ම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි සහ සහකාර සාමාන්‍යාධිකාරි යන ප්‍රධාන තනතුරු ප්‍රමාණවත් සුදුසුකම් ඇති නිලධාරීන්ගෙන් ප්‍රමාදයකින් තොරව පිරවිය යුතු වීම. |
| ii. | දේශීය හා විදේශීය අරමුදල් භාවිතා කරන ජල සම්පාදන හා සනීපාරක්ෂක සේවා ව්‍යාපෘති විශාල ප්‍රමාණයක් මණ්ඩලය විසින් සිදු කර ගෙන යන නමුදු මණ්ඩලයේ තාක්ෂණික විගණන අංශයට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කොට නොතිබුණි. | මෙම අංශය නුදුරු අනාගතයේදී ප්‍රතිව්‍යුහගත කිරීමට සැලසුම් කර ඇත. | තාක්ෂණික විගණන අංශයට ප්‍රමාණවත් විගණන කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීම අවශ්‍ය වීම. |

| | | | |
|---|---|---|---|
| iii. | විදේශ අරමුදල් යටතේ මූල්‍යනය වන සංවර්ධන ව්‍යාපෘති සඳහා එක් අභ්‍යන්තර විගණකවරයෙක් පමණක් පත් කර තිබුණි. | විදේශ මූල්‍යන ව්‍යාපෘති විගණනය සඳහා එක් අභ්‍යන්තර විගණකවරයෙකු වර්තමානයේ අනුයුක්ත කර ඇති අතර භ්‍රමණීය පදනම මත අනෙක් කාර්ය මණ්ඩලය අනුයුක්ත කරනු ලැබේ. 2016.06.10 දිනැති අංක 02/2016 දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛයට අනුව විදේශ මූල්‍යන ව්‍යාපෘති සඳහා අභ්‍යන්තර විගණකවරු බඳවා ගැනීමට මණ්ඩලය විසින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඉල්ලා තිබේ. උක්ත දිනටත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමැතිය ලබා දී නැත. | කළමනාකරණ විගණන චක්‍රෙල්ඛ සමග අනුගත වන බවට සහතික විය යුතු වීම. |

**4.2 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඵලදායී කළමනාකරණ උපකරණයක් ලෙස අයවැය භාවිතා කර නොමැති බව අභවමින් සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත සහ තථ්‍ය වෙනත් මෙහෙයුම් වියදම්, මූල්‍ය වියදම් සහ මූල්‍ය ආදායම් හි ආදායම් සහ වියදම් අතර සියයට 14 සිට සියයට 9325 දක්වා සැලකිය යුතු වෙනස්කම් නිරීක්ෂණය විය. | රු.2,428,963,000 ක අලාභයක් සඳහා 2019 වර්ෂයේ අයවැය පිළියෙල කොට ඇත. එහෙත් සත්‍ය අලාභය රු.1,176,834,636 කි. | සැලකිය යුතු විචලනයන් අවම කිරීම සඳහා පියවර ගත යුතු වීම. |

**4.3 තිරසාර සංවර්ධන අරමුණු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසාර සංවර්ධන අරමුණු පිළිබඳ න්‍යාය පත්‍රය -2030 පිළිබඳව දැනුවත්වීමෙන් අනතුරුව, විශ්වීය හා සාධාරණ ලෙස සැමට සුරක්ෂිත හා දැරිය හැකි ලෙස පානීය ජලය සඳහා ප්‍රවේශ වීම සහ ප්‍රමාණවත් හා සාධාරණ සනීපාරක්ෂාව සඳහා ප්‍රවේශය ලබා දීම, කාන්තාවන්ගේ හා ගැහැණු ළමයින්ගේ හා අවධානමට ලක්විය හැකි | 2019.07.02 දිනැති මේ සම්බන්ධයෙන් වන ජල සම්පාදන අමාත්‍යාංශයේ චක්‍රලේඛය අනාගත මෙහෙයුම් හා සංවර්ධන සැලසුම් තුළට අදාළ ක්‍රියාකාරකම් ඇතුළත් කිරීමටත් එමඟින් ඇතිකරගත් ඉලක්කයන් කරා ළඟාවීමට අදාළ අය වැයට ඇතුළත් කිරීමටත් සියලුම අතිරේක සාමාන්‍යාධිකාරීවරුන්ට 2019.07.12 දින ඉදිරිපත් කරනු ලැබීය.<br><br>අමාත්‍යාංශයේ නායකත්වය යටතේ සංඛ්‍යා ලේඛන හා සංගණන දෙපාර්තමේන්තුව | i)අදාළ ඉලක්ක කරා ළඟාවීමට මෙන්ම කාර්ය සාධනය ඇගයීම සඳහාත් තිරසර සංවර්ධන අරමුණු විෂය පථය යටතට එන අනෙකුත් අරමුණු, ඉලක්ක හඳුනා ගැනීම සඳහා සංඛ්‍යා ලේඛන දත්ත සහ සන්ධිස්ථානයන් හඳුනා ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතු වීම. |

තත්වයන්හි සිටින අයගේ අවශ්‍යතා කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීම 2030 තිරසර සංවර්ධන අරමුණු ලෙස මණ්ඩලය හඳුනාගෙන තිබුණි. කෙසේ වෙතත්, කාර්ය සාධනය ඇගයීම මෙන්ම ඊට අදාළ ඉලක්ක ලඟා කර ගැනීමේදී එහි විෂය පථයට අයත් අනෙකුත් අරමුණු, ඉලක්ක සහ සංඛ්‍යාන දත්ත හඳුනා ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. තවද, 2019 වර්ෂය අවසාන වන විටත් තිරසාර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් මණ්ඩලය විසින් කිසිදු අභ්‍යන්තර චක්‍රලේඛයක් හෝ මාර්ගෝපදේශයක් නිකුත් කර නොතිබුණි.

ඊට අමතරව, මණ්ඩලයට අදාළ දර්ශක සම්බන්ධයෙන් සියලු පාර්ශවයන් නියෝජනය කරන දත්ත වෙන් කිරීම සඳහා කිසිදු ක්‍රමවේදයක් 2020 මාර්තු 31 වන විටත් අනුගමනය කර නොතිබුණි.

සමඟ මෙම අරමුණු සඳහා දත්ත රැස් කිරීම සඳහා ප්‍රශ්නාවලියක් ගොඩනැගීමට 2018 සහ 2019 වර්ෂවලදී මණ්ඩලය විසින් කථිකාවත් කිහිපයක් සිදු කරන ලදී.

ii) තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කරවීම සම්බන්ධයෙන් අභ්‍යන්තර චක්‍රලේඛ හා මඟ පෙන්වීම් නිකුත් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වීම.

iii) මණ්ඩලයට අදාළ දර්ශක සම්බන්ධයෙන් සියලු පාර්ශවයන් නියෝජනය කරන දත්ත වෙන් කිරීම සඳහා ක්‍රමවේදයක් අනුගමනය කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වීම.